# කාර්ය සාධන වාර්තාව

# 2010

## ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව


*නො. 42,*

*ශ්‍රීමත් මාකස් ප්‍රනාන්දු මාවත,*

*තැ.පෙ. 537,*

*කොළඹ - 07.*

# ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව.

## ඉදිරි දැක්ම

*"ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ හා*
*සියළු කෘෂිකාර්මික ඉඩම්වල තිරසාර*
*සංවර්ධනය"*

## මෙහෙවර

*"ශ්‍රී ලාංකීය ගොවිජන සමාජයේ තිරසාර*
*සංවර්ධනය හා*
*සියළු කෘෂිකාර්මික ඉඩම්වලින්*
*ප්‍රශස්ථ ඵලදායිතාවයක් ලබා ගත හැකි වන පරිදි*
*ආයතනික, සහායක, නෛතික හා කළමනාකරණ*
*සේවාවන් සැකසීම හා කාලානුරූපව*
*පවත්වා ගෙන යාම"*

## ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් තුමාගෙන්.........

හඳුනාගත් ගිණුම් වසරක් තුල රාජ්‍ය ආයතනයක් සිය අභිමතාර්ථ ඉටු කර ගැනීම සඳහා ඉටුකරන ලද කාර්ය භාරය හා ඒ සඳහා යොදාගත් සම්පත් පිලිබඳ තොරතුරු එම ආයතනයේ වාර්ෂික වාර්තාව තුල අන්තර්ගතවේ.

ආසියාවේ ආශ්චර්ය කරා මෙරට මෙහෙයවන මහින්ද චින්තන රාමුව තුලට අනුගත වෙමින්, ක්‍රිස්තු පූර්ව යුග වලදී පවා මෙරට සාර්ථකව අත්හදා බැලූ කෘෂිකර්මය පාදක කරගත් ඉඩම් හා ජල කළමනාකරණ ප්‍රතිපත්ති අඛන්ඩව ක්‍රියාත්මක කිරීම අරමුණු කර මෙරට ගොවි ප්‍රජාව හා අත්වැල් බැඳගනිමින් කටයුතු කරන ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සතු සම්පත් හා එහි සමස්ථ කාර්යසාධනය විදහා පාන මෙම වාර්ෂික වාර්තාව එලි දැක්වීමට හැකිවීම ගැන සතුටට පත්වෙමි.

එවැනි කාර්යසාධනයක් කරා අප මෙහෙය වූ ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යතුමන් ප්‍රධාන අමාත්‍යාංශයටත්, මෙම වසරේ දෙපාර්තමේන්තු ඉලක්ක හා අභියෝග ජයගැනීම සඳහා අඛණ්ඩව කැපවුනු මෙම දෙපාර්තමේන්තුවේ සියලුම කාර්ය මණ්ඩලයටත්, 2010 ක්‍රියාත්මක සැලැස්ම යථාර්තයක් බවට පත්කර ගැනීම සඳහා අප හා අත්වැල් බැඳ ගත් මෙරට සියලුම ගොවි ජනතාවටත්, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව 2010 පාලන වාර්තාව සමඟින් මාගේ අවංක ස්තුතිය පුද කරමි.

රවීන්ද්‍ර හේවාවිතාරණ
ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්

# පටුන

පිටු අංකය


| | | |
|---|---|---|
| 1 . | ආයතන අංශය | 1 - 9 |
| 2. | ආයතනික සංවර්ධන අංශය | 10 - 13 |
| 3 . | සංවර්ධන හා ප්‍රගති පාලන අංශය | 14 - 20 |
| 4. | ජල කළමනාකරණ අංශය | 21 - 22 |
| 5. | නීති අංශය | 23 - 25 |
| 6. | ගිණුම් අංශය | 26 - 27 |
| 7 . | අභ්‍යන්තර විගණන අංශය | 28 |
| 8. | ඵලදාවර්ධන හා අලෙවි අංශය | 29 |
| 9. | ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය | 30 - 31 |
| 10. | ප්‍රවාහන අංශය | 32 |
| # | ඇමුණුම් | |

# 1. ආයතන අංශය

## 1.1 දෙපාර්තමේන්තුවේ සේවක සංඛ්‍යාව

දීපව්‍යාප්ත, ඒකාබද්ධ හා දෙපාර්තමේන්තුගත තනතුරු ඇතුළුව මෙම දෙපාර්තමේන්තුවට අනුමත සේවක සංඛ්‍යාව 12019 කි. 2010 වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වූ සංඛ්‍යාව 10701 කි. පුරප්පාඩු වූ සංඛ්‍යාව 1281 කි. මීට අමතරව ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයෙන් අනුයුක්ත කර ඇති කෘෂිකර්ම පර්යේෂණ හා එලදා වර්ධන නිලධාරීන් 13 ක්ද කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර නිලධාරින් 70 ක්ද සංවර්ධන සහකාර නිලධාරීන් 89 ක්ද මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලැබේ. මෙයින් කෘෂිකර්ම පර්යේෂණ හා එලදා වර්ධන නිලධාරීන් අමාත්‍යාංශයෙන් වැටුප් ලැබීමේ පදනම මත මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත කර ඇත.

ප්‍රධාන කාර්යාලයේ කටයුතු සඳහා ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් , අතිරේක ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් තනතුර හා කොමසාරිස් තනතුරු 03 ක්ද නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 05 ක්ද අනුමත වී ඇත. සමාලෝචන වර්ෂය අවසානය වන විට මින් කොමසාරිස් තනතුරු 01ක් හා නියෝජ්‍ය කොමසාරිස් තනතුරු 05 ක් පුරප්පාඩුව පැවතුණි. දෙපාර්තමේන්තුව සඳහා සහකාර කොමසාරිස් තනතුරු 36 ක් අනුමත වී ඇති අතර ඉන් තනතුරු 09ක් පුරප්පාඩු වී පැවතුණි. ශ්‍රී ලං.ප.සේ නොවන නියෝජ්‍ය කොමසාරිස් (නීති) තනතුර පුරප්පාඩුව පැවතුණු අතර 28 ක් වූ අනුමත දෙපාර්තමේන්තු සහකාර කොමසාරිස් තනතුරු සංඛ්‍යාවෙන් සමාලෝචන වර්ෂය අවසානය වන විට සේවයේ නිරත වූ සංඛ්‍යාව 05 කි.

රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ අධි පංතියේ පුරප්පාඩු 08 ක් වූ අතර සමාලෝචන වර්ෂය අවසානය වන විට රාජ්‍ය කළමනාකරණ සහකාර සේවයේ පුරප්පාඩු වූ සංඛ්‍යාව 165ක් විය. මේ තත්ත්වය හේතුවෙන් දෙපාර්තමේන්තුවේ රාජකාරී යාවත්කාලීනව පවත්වා ගැනීම සඳහා දෙපාර්තමේන්තුගත තනතුරුවල නිලධාරීන්ගේ සහාය ලබා ගන්නා ලදී.

## 1.2 කාර්ය මණ්ඩල සංවිධාන ව්‍යුහය.

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා ලෙස ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය භාරය සාර්ථක කර ගැනීම සඳහා අවශ්‍ය කාර්ය සාධන මට්ටම පවත්වා ගැනීමට වග කියන අතරම, ඒ සඳහා තමන් යටතේ සේවය කරන විවිධ මට්ටම්වල නිලධාරීන්ට වගකීම් හා බලතල පවරා ඇත.

දෙපාර්තමේන්තුවේ අරමුණු හා අභිමතාර්ථ ලඟා කර ගැනීම සඳහා සහාය ලබා දුන් සමාලෝචන වර්ෂ අවසානය වන විට සේවයේ නිරත වී සිටි දෙපාර්තමේන්තුවට අනුමත විවිධ තනතුරුවල සේවක සංඛ්‍යාව පහත පරිදි වේ.

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**2010-12-31 දිනට සේවයේ නිරත වූ සේවක සංඛ්‍යාව.**

| අංකය | තනතුර | සේවය | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| 01 | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලං.ප.සේ. විශේෂ | 01 | 01 | - |
| 02 | අතිරේක කොමසාරිස් ජනරාල් | ශ්‍රී ලං.ප.සේ. විශේෂ | 01 | 01 | - |
| 03 | කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ. I | 03 | 02 | 01 |
| 04 | නියෝජ්‍ය කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ. | 08 | 03 | 05 |
| 05 | සහකාර කොමසාරිස් | ශ්‍රී ලං.ප.සේ. III | 36 | 27 | 09 |
| 06 | නියෝජ්‍ය කොමසාරිස් (නීති) | ශ්‍රී ලං.ප.සේ. නොවන | 01 | - | 01 |
| 07 | ප්‍රධාන ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. I | 01 | 01 | - |
| 08 | ගණකාධිකාරී | ශ්‍රී ලං.ග.සේ. | 06 | 07 | - |
| 09 | ඉංජිනේරු | ශ්‍රී ලං.ඉ.සේ. | 11 | 09 | 02 |
| 10 | සහකාර කොමසාරිස් | දෙපාර්තමේන්තු | 28 | 05 | 23 |
| 11 | ගොවිජන සංවර්ධන නිළධාරී | දෙපාර්තමේන්තු | 610 | 483 | 127 |
| 12 | භෂා පරිවර්තක සේවය | ඒකාබද්ධ | 02 | - | 02 |
| 13 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය (අධි) | ඒකාබද්ධ | 10 | 02 | 08 |
| 14 | ගොවි බැංකු ව්‍යාපෘති සහකාර | දෙපාර්තමේන්තු | 100 | 51 | 49 |
| 15 | නීති සහකාර | දෙපාර්තමේන්තු | 25 | 12 | 13 |
| 16 | අයවැය සහකාර | - | 01 | 01 | - |
| 17 | සැලසුම් ශිල්පී | දෙපාර්තමේන්තු | 01 | 01 | - |
| 18 | යාන්ත්‍රික වැඩ අධිකාරී | දෙපාර්තමේන්තු | 02 | 02 | - |
| 19 | ශ්‍රී ලංකා තාක්ෂණ සේවය | ශ්‍රී ලං.තා.සේ විශේෂ | 13 | 08 | 05 |
| | | ශ්‍රී.ලං.තා.සේ 1<br>ශ්‍රී.ලං.තා.සේ 11 | 100 | 88 | 12 |
| 20 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | ඒකාබද්ධ | 534 | 369 | 165 |
| 21 | ප්‍රචාරක නිළධාරී | දෙපාර්තමේන්තු | 01 | - | 01 |
| 22 | ලසු/යතුරු ලේඛක* | දෙපාර්තමේන්තු | 47 | 20 | - |
| 23 | ක්ෂේත්‍ර සහකාර * | දෙපාර්තමේන්තු | 06 | 04 | - |
| 24 | කම්වු ලිපිකරු | දෙපාර්තමේන්තු | 540 | 475 | 65 |
| 25 | රියදුරු සේවය | ඒකාබද්ධ | 91 | 72 | 19 |
| 26 | රිය සහායක | දෙපාර්තමේන්තු | 18 | 08 | 10 |
| 27 | මුරකරු | දෙපාර්තමේන්තු | 83 | 62 | 21 |
| 28 | ඩෝසර් යන්ත්‍ර ක්‍රියාකරු | දෙපාර්තමේන්තු | 17 | 17 | - |
| 29 | කාර්යාල කාර්ය සහායක | ඒකාබද්ධ | 79 | 73 | 06 |
| 30 | එක්ස්කැවේටර් යන්ත්‍ර ක්‍රියාකරු | දෙපාර්තමේන්තු | 04 | - | 04 |
| 31 | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර | දෙපාර්තමේන්තු | 9600 | 7388<br>1500 | 712 |
| 32 | සංචාරක බංගලා භාරකරු | දෙපාර්තමේන්තු | 07 | 02 | 05 |
| 33 | නුපුහුණු කම්කරු* | දෙපාර්තමේන්තු | 17 | 8 | - |
| එකතුව | | | 12004 | 10702 | 1265 |

*** යටපත් වී යන සේවාවකි**

මීට අමතරව ගොවිජන සේවා හා වනජීවී අමාත්‍යාංශයෙන් අනුයුක්ත කර ඇති පහත තනතුරුවල නිලධාරීන්ද මෙම දෙපාර්තමේන්තුවේ සේවය කරනු ලබයි

| | |
|---|---|
| කෘෂිකර්ම පර්යේෂණ හා එළදා වර්ධන නිළධාරී | 13 |
| කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර | 70 |
| සංවර්ධන සහකාර | 89 |

## 1.3 ආයතන කටයුතු

**I 2010 වර්ෂය තුළ දීපව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ විචලතා පහත පරිදි වේ.**

**දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු වී ගිය ශ්‍රී.ලං.ප.සේ. නිලධාරීන්**

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරු වී ගිය දිනය | සේවා ස්ථානය |
|---|---|---|---|
| 01 | එම්.පී.එන්.එම්.වික්‍රමසිංහ මහතා | 2010.01.01 | ඌව පළාත් සභාව |
| 02 | එම්.පී.පෙරේරා මහත්මිය | 2010.03.17 | රාජ්‍ය සේවා කොමිෂන් සභාව |
| 03 | ඒ.එම්.ඩබ්.ඒ.අමුණුගම මහතා | 2010.05.13 | උතුරු මැද පළාත් සභාව |
| 04 | එච්.එම්.එම්.යූ.බී.හේරත් මහතා | 2010.05.18 | කොත්මලේ ප්‍රා.ලේ.කාර්යාලය |
| 05 | පී.එච්.සාලිය බණ්ඩාර මහතා | 2010.08.30 | මහනුවර ප්‍රා.ලේ.කාර්යාලය |
| 06 | කේ.ජී.ලැනරෝල් මහතා | 2010.11.17 | රබර් සංවර්ධන දෙපාර්තමේන්තුව |

2010 වර්ෂය තුල ශ්‍රී ලං.ග.සේ. හා ශ්‍රී ලං.ඉ.සේ. නිලධාරීන් දෙපාර්තමේන්තුවෙන් පිටතට ස්ථාන මාරු වීම් ලබා නොමැත.

**දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වී පැමිණි ශ්‍රී.ලං.ප.සේ. නිලධාරීන්**

| අනු අංකය | නිලධාරියාගේ නම | ස්ථාන මාරු වී පැමිණි දිනය | සේවා ස්ථානය |
|---|---|---|---|
| 01 | එම්.යූ.නිශාන්ත මහතා | 2010.02.08 | රත්තොට ප්‍රා.ලේ.කාර්යාලය |
| 02 | එම්.ජෙගු මහතා | 2010.02.12 | සන්දිලිපායි ප්‍රා.ලේ.කාර්යාලය |
| 03 | ඒ.එම්.ආරිෆ් මහතා | 2010.02.12 | පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ දෙපා. |
| 04 | එන්.පී.අමරතුංග මහතා | 2010.04.26 | නිවිතිගල ප්‍රා.ලේ. කාර්යාලය. |
| 05 | ඩබ්.එම්.ගුණවර්ධන මහතා | 2010.05.13 | රාජ්‍ය පරිපාලන හා ස්ව. කටයුතු අමා. |
| 06 | ආර්.එම්.කේ.ආර්.බී.රත්නායක මහතා | 2010.06.28 | මධ්‍යම පළාත් ඉඩම් කොමසාරිස් කාර්යාලය |
| 07 | ඉසඩ්.ඒ.එම්.ෆයිසාල් මහතා | 2010.08.30 | කෑගල්ල ප්‍රා.ලේ. කාර්යාලය |
| 08 | එම්.එස්.ඒ.සේනාරත්න මිය | 2010.11.04 | ඕපනායක ප්‍රා.ලේ. කාර්යාලය |
| 09 | පී.ජී.සෝමරත්න මහතා | 2010.12.13 | යටලමත්ත ප්‍රා.ලේ.කාර්යාලය |

2010 වර්ෂය තුල ශ්‍රී ලං.ග.සේ. හා ශ්‍රී ලං.ඉ.සේ. නිලධාරීන් දෙපාර්තමේන්තුව වෙත ස්ථාන මාරු වීම් ලබා නොමැත.

**නව පත්වීම් ලද දීප ව්‍යාප්ත සේවාවල නිලධාරීන්ගේ තොරතුරු**

| අනු අංකය | නිලධාරියාගේ නම | සේවය | දෙපාර්තමේන්තුවට අනුයුක්ත වූ දිනය |
|---|---|---|---|
| 01 | කේ.ඒ.එස්.සමරජීව මිය | ශ්‍රී ලං.ප.සේ. | 2010.02.01 |
| 02 | ජේ.ඒ.රවීශා දයාරත්න මිය | ශ්‍රී ලං.ඉ.සේ. | 2010.07.01 |
| 03 | එම්.එම්.මුනාස් මහතා | ශ්‍රී ලං.ඉ.සේ. | 2010.07.01 |
| 04 | ඊ.එම්.ආර්.එස්.ආර්.සෙනෙවිරත්න මිය | ශ්‍රී ලං.ඉ.සේ. | 2010.10.04 |

ජේ.ඒ.රවීශා දයාරත්න මිය 2010.07.19 දින සිට රාජ්‍ය සේවයෙන් ඉල්ලා අස් වී ඇත.

## II. නව බඳවා ගැනීම්

- ගොවිජන සංවර්ධන නිලධාරී තනතුර
  2009.06.13 දින පැවති විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත 2010.02.10 දින 40ක් හා 2010.07.15 දින 26 ක් හා ඉන් අනතුරුව නිලධාරීන් දෙදෙනෙකු සමග 68 ක් බඳවා ගත් අතර මින් 11 දෙනෙකු වෙනත් තනතුරු වලට මුදා හැර ඇත.
- කම්තු ලිපිකරු තනතුර
  2009.08.01 දින පැවති විවෘත තරඟ විභාගයේ ප්‍රතිඵල මත 2010.08.10 දින නිලධාරීන් 86 දෙනෙකු බඳවා ගත් අතර මින් 07 දෙනෙකු තනතුරින් ඉවත් වී ඇත.
- නීති සහකාර
  සමාලෝචන වර්ෂය තුල එක් නිලධාරියකු දෙපාර්තමේන්තුවට එකතු වී ඇත.
- විශාල පුරප්පාඩු සංඛ්‍යාවක් පැවති රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය සඳහා සමාලෝචන වර්ෂය තුල කිසිදු නිලධාරියකු අනුයුක්ත නොකිරීම දෙපාර්තමේන්තුවේ කටයුතු යාවත්කාලීනව පවත්වා ගැනීමට ඉමහත් බාධාවක් වූ බව විශේෂයෙන් සඳහන් කළ යුතුය.

## III. පත්වීම් ස්ථිර කිරීම

සමාලෝචන වර්ෂය තුල පහත තනතුරු දරන නිලධාරීන්ගේ පත්වීම ස්ථිර කරනු ලැබීය.

| තනතුර | ස්ථිර කළ සංඛ්‍යාව |
|---|---|
| • ගොවි බැංකු ව්‍යාපෘති සහකාර | 18 |
| • නීති සහකාර | 02 |

## IV. උසස් වීම්

සමාලෝචන වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ සිටින ශ්‍රී ලං.ප.සේ. III පන්තියේ නිලධාරීන් 05 දෙනෙකු II පන්තියට ද, II පන්තියේ නිලධාරීන් 04 දෙනෙකු I පන්තියට ද, උසස් වීම් ලබා ඇත.

## V. තනතුර අතහැර යෑම් / ඉල්ලා අස්වීම්/ මිය යෑම්

සමාලෝචන වර්ෂය තුල තනතුර අත්හැර යාම් , ඉල්ලා අස්වීම් හා මිය යෑම් සිදු වූ තනතුරුවල විස්තර පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | අත්හැර යාම් සංඛ්‍යාව | ඉල්ලා අස්වීම් සංඛ්‍යාව | මිය යෑම් සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 01 | ගොවිජන සංවර්ධන නිලධාරී තනතුර | 03 | - | - |
| 02 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 01 | - | - |
| 03 | කෘෂිකර්ම පර්යේෂණ හා නිෂ්පාදන සහකාර | 14 | 01 | 04 |
| 04 | කම්තු ලිපිකරු තනතුර | 01 | 01 | 01 |
| 05 | කාර්යාල කාර්ය සහායක තනතුර | 02 | - | - |

## VI. ස්ථාන මාරුවීම්

දීප ව්‍යාප්ත සේවාවන් හැරුණු විට ඒකාබද්ධ සේවාවල නිලධාරීන්ගේ ස්ථාන මාරුවීම් තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | ස්ථාන මාරු වී ගිය සංඛ්‍යාව | ස්ථාන මාරු වී පැමිණි සංඛ්‍යාව |
|---|---|---|---|
| 01 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 26 | 21 |
| 02 | රියදුරු | 04 | 04 |
| 03 | කාර්යාල කාර්ය සහායක තනතුර | 11 | 09 |

### VII. විශ්‍රාම ගැනීම

සමාලෝචන වර්ෂය තුල රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගන්නා ලද නිලධාරීන්ගේ තොරතුරු පහත පරිදි වේ.

| අනු අංකය | තනතුර | විශ්‍රාම ගිය සංඛ්‍යාව | |
|---|---|---|---|
| | | වි.වැ.ව්‍යා. 2.17 වගන්තියෙන් | වි.වැ.ව්‍යා. 2.12 වගන්තියෙන් |
| 01 | ශ්‍රී ලංකා පරිපාලන සේවය | 01 | - |
| 02 | ශ්‍රී ලංකා ඉංජිනේරු සේවය | 01 | - |
| 03 | ගොවිජන සංවර්ධන නිලධාරී සේවය | 23 | 02 |
| 04 | රාජ්‍ය කළමනාකරණ සහකාර සේවය | 15 | - |
| 05 | තාක්ෂණ සේවය | 03 | - |
| 06 | කම්වු ලිපිකරු | 23 | - |
| 07 | රියදුරු | 02 | - |
| 08 | කාර්යාල කාර්ය සහායක තනතුර | 04 | - |
| 09 | මුරකරු | 03 | - |

## 1.4 කාර්යක්ෂමතා කඩඉම්

සමාලෝචන වර්ෂය තුල දෙපාර්තමේන්තුගත තනතුරු වන ගොවිජන සංවර්ධන නිලධාරී තනතුරේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය 2010.12.11 දින ද කම්වු ලිපිකරු තනතුරේ කඩඉම් විභාගය 2010.12.18 දින ද පැවැත් වූ අතර ප්‍රතිඵල නිකුත් කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.

ඒකාබද්ධ සේවාවන් වන රියදුරු සේවයේ කාර්යක්ෂමතා කඩඉම 2010.09.15 දින පවත්වා 2010.10.14 දින ප්‍රතිඵල නිකුත් කරන ලදී. කාර්යාල සේවක සේවයේ කාර්යක්ෂමතා කඩඉම් විභාගය සඳහා ඉදිරිපත් වීමට සේවක මහතුන් නොසිටි බැවින් අදාල විභාගය පවත්වා නොමැත.

## 1.5 විදේශ සංචාර හා පුහුණු

සමාලෝචන වර්ෂය තුල විදේශ ශිෂ්‍යත්ව, සම්මේලන හා වැඩමුළු සඳහා සහභාගී වූ නිලධාරීන් පහත පරිදි වේ.

- කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර අනුගා ලියනගේ මහත්මිය 2010.01.01 දින සිට 2011.12.31 දින දක්වා ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්ව විද්‍යාලයේ පශ්චාත් උපාධි පාඨමාලාව හැදෑරීම සඳහා විදේශ ගත වී ඇත.
- කෘෂි නිෂ්පාදන ව්‍යාපෘති සහකාර පී.එම්.ඩී.මුණසිංහ මහත්මිය 2010.05.22 දින සිට 2010.05.29 දින දක්වා චීනයේ බීජිං නුවර පැවති "Quality infrastructure for food safety – 2009 phase II follow up seminar – may 2010 " සම්මේලනය සඳහා සහභාගී වීමට විදේශ ගත වී ඇත.

## 1.6 විනය කටයුතු

සමාලෝචන වර්ෂය තුල දෙපාර්තමේන්තුව වෙත විධිමත් විනය පරීක්ෂණ කටයුතුවලට අදාලව පැමිණිලි 76 ක් ලැබී ඇති අතර ඉන් 12 ක වැඩ අවසන් වී ඇත. සමාලෝචන වර්ෂය තුල දී විනය හේතු මත වැඩ තහනම් කර ඇති සංඛ්‍යාව 12 ක් වන අතර විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහයේ 2.12 අනුව 02 ක් විශ්‍රාම ගන්වා ඇත.

## 1.7 පුහුණු හා හැකියා වර්ධන

සමාලෝචන වර්ෂය තුල දී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ කුසලතා, ආකල්ප හා දැනුම වර්ධනය කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ. මේ සඳහා රුපියල් ලක්ෂ 25 ක ප්‍රතිපාදන වෙන් වී තිබූ අතර වර්ෂ අවසානය වන විට රු. 24,45482.25 ක් වැය කර තිබුණි.

| පුහුණුව ලබා දුන් තනතුර | පුහුණු වැඩසටහන පිළිබඳ විස්තරය | සහභාගි වූ සංඛ්‍යාව |
|---|---|---|
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | සිගාස් පුහුණුව | 100 |
| ගොවිජන සංවර්ධන නිලධාරී (බාහිර) | සේවාරම්භක පුහුණුව -1 | 40 |
| ගොවිජන සංවර්ධන නිලධාරී | සේවාරම්භක පුහුණුව -2 | 40 |
| ගොවිජන සංවර්ධන නිලධාරී | නූතන කාර්යාල කළමනාකරණය | 02 |
| ගොවිජන සංවර්ධන නිලධාරී හා කම්ටු ලිපිකරු | බදුල්ල දිස්ත්‍රික්කයට අනුයුක්ත ගොවිජන සංවර්ධන නිලධාරී හා කම්ටු ලිපිකරුවන් සඳහා මධ්‍යස්ථාන ගිණුම් කටයුතු පුහුණුව | 50 |
| තෝරාගත් උපාධිධාරීන් | විගණන සහකාර පුහුණුව | 60 |
| රාජ්‍ය කළමනාකරණ සහකාර නිලධාරීන් | වැටුප් පරිවර්තන පුහුණුව | 50 |
| ගොවිජන සංවර්ධන නිලධාරි (අභ්‍යන්තර බඳවා ගත්) | ගිණුම් කටයුතු පුහුණුව | 50 |
| ගොවිජන සංවර්ධන නිලධාරී - 1 කණ්ඩායම | සේවාරම්භක පුහුණුව -1අදියර | 30 |
| ගොවිජන සංවර්ධන නිලධාරී - 2කණ්ඩායම | සේවාරම්භක පුහුණුව -2 අදියර ක්ෂේත්‍ර අධ්‍යාපන චාරිකාව - මාතලේ | 30 |
| තාක්ෂණ නිලධාරීන් | තාක්ෂණ නිලධාරීන් සඳහා ජල කළමනාකරණ පුහුණුව | 20 |
| කම්ටු ලිපිකරු - 1 කණ්ඩායම | සේවාරම්භක පුහුණුව | 50 |
| කම්ටු ලිපිකරු - 2 කණ්ඩායම | සේවාරම්භක පුහුණුව | 50 |
| ගොවිජන සංවර්ධන නිලධාරී | ගිණුම් කටයුතු පුහුණුව | 40 |
| විගණන සහකාරවරු | විගණන සහකාර වරුන්ගේ පුහුණුව | 50 |
| ගොවිජන සංවර්ධන නිලධාරී | විනය කාර්ය පටිපාටි පුහුණුව | 50 |
| විගණන සහකාරවරු | විගණන සහකාර වරුන්ගේ පුහුණුව | 50 |
| මාණ්ඩලික නිලධාරීන් | පශ්චාත් උපාධි සහ ඩිප්ලෝමා පාඨමාලා | 01 |
| මොණරාගල දි.අනුයුක්ත ගො.සං.නි. හා කම්ටු ලිපිකරු නිලධාරීන් | මධ්‍යස්ථාන ගිණුම් පුහුණුව | 40 |
| පුත්තලම දි.අනුයුක්ත ගො.සා.නි. හා කම්ටු ලිපිකරු නිලධාරීන් | මධ්‍යස්ථාන ගිණුම් පුහුණුව | 25 |
| පුත්තලම දි.අනුයුක්ත ගො.සා.නි. හා කම්ටු ලිපිකරු නිලධාරීන් | මධ්‍යස්ථාන ගිණුම් පුහුණුව | 90 |
| ගොවි බැංකු නිලධාරීන් | උතුරු නැගෙනහිර ගොවි බැංකු නිලධාරීන් පුහුණු කිරීම | 60 |

## 1.8 සාකච්ඡා

සමාලෝචන වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලයේ මාණ්ඩලික නිලධාරීන්, දිස්ත්‍රික් භාර නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වරුන්, ඉංජිනේරුවන් හා දිස්ත්‍රික් තාක්ෂණ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් සාකච්ඡා 09 ක් හා වෙනත් සකාච්ඡා 01 ක් සමග සාකච්ඡා 10 ක් පැවැත්විය. ඒ සම්බන්ධ තොරතුරු පහත පරිදි වේ.

| සාකච්ඡාව පැවැත්වූ දිනය | ස්ථානය |
|---|---|
| 2010.02.11 හා 12 දෙදින | පදනම් ආයතනය |
| 2010.03.13 දින | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය |
| 2010.04.29 හා 30 දෙදින | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය |
| 2010.06.21 හා 22 දෙදින | වක්වැල්ල කළමනාකරණ පුහුණු ආයතනය |
| 2010.08.26 දින | ප්‍රධාන කාර්යාලය |
| 2010.09.16 හා 17දෙදින | HARTI ආයතනය |
| 2010.09.30 දින | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය |
| 2010.11.02 දින | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය |
| 2010.12.09 හා 10 දෙදින | පිළිමතලාව ග්‍රාම සංවර්ධන පුහුණු ආයතනය |
| අනෙකුත් සාකච්ජා | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යාලීය ශ්‍රවනාගාරය |

**1.9** **සමාලෝචන වර්ෂය තුල දෙපාර්තමේන්තුවේ අරමුණු අභිමතාර්ථ ලඟා කර ගැනීම උදෙසා තම දායකත්වය ලබා දුන් දීප ව්‍යාප්ත සේවාවන්වල නිලධාරීන් පහත දක්වා ඇත.**

### 1.9.1 ප්‍රධාන කාර්යාලයේ ශ්‍රී ලං.ප.සේ. නිලධාරීන්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | රවීන්ද්‍ර හේවාවිතාරණ මහතා | ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල් |
| 02 | සුමිත්‍රා කන්නන්ගර මිය | අතිරේක කොමසාරිස් ජනරාල් |
| 03 | එස්.එම්.ජී.එන්. ධර්මසේකර මහතා | කොමසාරිස් (මා.ස.සං) |
| 04 | ඩබ්.ඒ.ඩී. කරුණාතිලක මහතා | කොමසාරිස් (සේවා) |
| 05 | ඒ.එම්. විජේසිංහ මහතා (කො.පදනම) | කොමසාරිස් (සංවර්ධන) |
| 06 | කේ.ඒ.එස්.සමරජීව මිය | සහකාර කොමසාරිස් (ආයතන) |
| 07 | එම්.ඒ.එල්.එස්.එන්.කේ.මන්ත්‍රීනායක මහතා | සහකාර කොමසාරිස් (එළදා අලෙවි) |

### 1.9.2 දිස්ත්‍රික් කාර්යාලවල ශ්‍රී ලං.ප.සේ නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | එන්.පී.අමරතුංග මහතා | සහකාර කොමසාරිස් - කොළඹ |
| 02 | චන්දන කුමාරසිංහ මහතා | සහකාර කොමසාරිස් - ගම්පහ |
| 03 | ඒ.එම්.ආරිෆ් මහතා | සහකාර කොමසාරිස් - කළුතර |
| 04 | අයි.කේ.ජී.මුතුබණ්ඩා මහතා | නියෝජ්‍ය කොමසාරිස් - මහනුවර |
| 05 | කේ.එම්.එල්.බී.කැකුලන්දර මහතා | සහකාර කොමසාරිස් - මහනුවර |
| 06 | පී.ජී.සෝමරත්න මහතා | සහකාර කොමසාරිස් - මාතලේ |
| 07 | ඩබ්.එම්.ගුණවර්ධන මහතා | සහකාර කොමසාරිස් - නුවරඑළිය |
| 08 | ඩී.එල්.කේ.ප්‍රියවංශ මහතා | සහකාර කොමසාරිස් - හම්බන්තොට |
| 09 | ජේ.දික්මාදුගොඩ මහතා | සහකාර කොමසාරිස් - මාතර |
| 10 | එම්.පී.ඩිරන්ජන් මහතා | සහකාර කොමසාරිස් - යාපනය |
| 11 | එන්.සිවලිංගම් මහතා | සහකාර කොමසාරිස් - මන්නාරම |
| 12 | එම්.ජෙගු මහතා | සහකාර කොමසාරිස් - වව්නියාව |
| 13 | එස්.ප්‍රනවනාදන් මහතා | සහකාර කොමසාරිස් - මුලතිව් |

| | | |
|---|---|---|
| 14 | ඊ.තයාරූපන් මහතා | සහකාර කොමසාරිස් - කිලිනොච්චිය |
| 15 | ආර්.රුෂාන්දන් මහතා | සහකාර කොමසාරිස් - මඩකළපුව |
| 16 | ඩී.එම්.එන්.දිසානායක මහතා | සහකාර කොමසාරිස් - අම්පාර |
| 17 | එස්.පුනිතකුමාර් මහතා | සහකාර කොමසාරිස් - ත්‍රිකුණාමළය |
| 18 | එම්.ඒ.බී.සී.ආලෝක බණ්ඩාර මහතා | නියෝජ්‍ය කොමසාරිස් - කුරුණෑගල |
| 19 | ඩී.එම්.ජී.බී.දිසානායක මහතා | සහකාර කොමසාරිස් - කුරුණෑගල |
| 20 | ඩබ්.ඒ.ආර්.එන්.එස්.විජයසිංහ මහතා | සහකාර කොමසාරිස් - පුත්තලම |
| 21 | ආර්.එම්.කේ.ආර්.බි.රත්නායක මහතා | සහකාර කොමසාරිස් - අනුරාධපුර |
| 22 | එම්.යූ.නිශාන්ත මහතා | සහකාර කොමසාරිස් - පොළොන්නරුව |
| 23 | එස්.එම්.ඩී.සී.සමරසේකර මහතා | සහකාර කොමසාරිස් - බදුල්ල |
| 24 | එම්.එස්.ඒ.සේනාරත්න මිය | සහකාර කොමසාරිස් - රත්නපුර |
| 25 | ඉසඩ්.ඒ.එම්.ෆයිසාල් මහතා | සහකාර කොමසාරිස් - කෑගල්ල |

### 1.9.3 දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලං.ග.සේ නිලධාරීන්

| අනු අංකය | නිලධාරියාගේ නම | තනතුර |
|---|---|---|
| 01 | එස්. කොඩිතුවක්කු මහතා | කොමසාරිස් (මුදල්) |
| 02 | රේණුකා කොළඹගේ මිය | නියෝජ්‍ය කොමසාරිස් (මුදල්) |
| 03 | ඩබ්.එම්.එම්.බී.එච්. ගුණරත්න මහතා | නියෝජ්‍ය කොමසාරිස් (මුදල්) |
| 04 | ඩී.පි.එස්. ප්‍රනාන්දු මිය | සහකාර කොමසාරිස් (මුදල්) |
| 05 | එම්.ඒ.අයි.එස්. මහානාම මිය | සහකාර කොමසාරිස් (මුදල්) |
| 06 | එම්.පී.කේ. ජයතුංග මෙය | සහකාර කොමසාරිස් (මුදල්) |
| 07 | ටී.ඒ.ඩබ්. නාරායන මෙය | සහකාර කොමසාරිස් (මුදල්) |
| 08 | එස්.පී. ගාමිණී මහතා | සහකාර කොමසාරිස් (මුදල්) |

### 1.9.4 දෙපාර්තමේන්තුවේ ශ්‍රී ලං.ඉ.සේ නිලධාරීන්

| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01 | ටී.එස්.විජේවර්ධන මහතා | ප්‍රධාන ඉංජිනේරු |
| 02 | ඩී.ඩී.ප්‍රභාත් විතාරණ මහතා | ඉංජිනේරු - ජල කළමනාකරණ |
| 03 | ආර්.එම්.යූ.රත්නායක මහතා | ප්‍රාදේශීය ඉංජිනේරු - කුරුණෑගල |
| 04 | කේ.එම්.බී.කෑඳරගම මහතා | ප්‍රාදේශීය ඉංජිනේරු -මහනුවර |
| 05 | ඒ.එල්.එම්.මහීර් මහතා | ප්‍රාදේශීය ඉංජිනේරු - අනුරාධපුර |
| 06 | වසන්ත අමරආරච්චි මහතා | ප්‍රාදේශීය ඉංජිනේරු - මොනරාගල |
| 07 | එච්.ජී.කේ. ප්‍රියශාන්ත මහතා | ප්‍රාදේශීය ඉංජිනේරු - හම්බන්තොට |
| 08 | එම්.එම්.මුනාස් මහතා | ප්‍රාදේශීය ඉංජිනේරු - අම්පාර |
| 09 | ඊ.එම්.ආර්.එස්.සෙනෙවිරත්න මිය | ප්‍රාදේශීය ඉංජිනේරු - රත්නපුර |

## 1.10 දෙපාර්තමේන්තුගත සහකාර කොමසාරිස්වරුන් පිළිබඳ විස්තර

| අනු අංකය | නම | සේවා ස්ථානය |
|---|---|---|
| 01 | ඩබ්.ඩබ්.එම්.ධර්මදාස මහතා | කෑගල්ල |
| 02 | ඒ.ආර්.එල්.එම්.ජවාඩ් මහතා | මහනුවර |
| 03 | එච්.එම්.පී.කේ.හේරත් මහතා | කුරුණෑගල (අනිවාර්ය නිවාඩු ගන්වා ඇත) |
| 04 | ඩබ්.ඒ.අයි.පෙරේරා මහත්මිය | කුරුණෑගල |
| 05 | ඩී.එම්.ඒ.දිසානායක මහතා | හලාවත |
| 06 | ඩබ්.එම්.එම්.බී.පහළගිරිබාව මහතා | අනුරාධපුර |
| 07 | එස්.ඒ.ඩබ්.සමරසිංහ මහතා | අනුරාධපුර |
| 08 | එම්.කේ.එල්.සමරවීර මහතා | අම්පාර |
| 09 | එම්.බී.අත්තනායක මහතා | මොනරාගල |

# 2. ආයතනික සංවර්ධන අංශය

ශ්‍රී ලාංකීය ගොවි ජනතාවට ස්ව ශක්තියෙන් හෙබි ස්ථාවර ආර්ථික හා සමාජ මට්ටමක් පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය වන පහසුකම් සලසාදීමේ සහ මැදිහත්වීමේ කාර්ය භාරය ඉටුකිරීමේ මෙහෙවර කොටගත් ආයතනික සංවර්ධන අංශය එම ක්‍රියාදාමය පහත දැක්වෙන අරමුණු ඔස්සේ 2010 වර්ෂය තුළ ක්‍රියාත්මක කර ඇත.

1. (කෙතට අරුණ) පොහොර සහනාධාර වැඩසටහන ක්‍රියාත්මක කිරීම
2. තෙත් කලාපීය ප්‍රදේශ වල පුරන් කුඹුරු අස් වැද්දීමේ ජාතික වැඩසටහන
3. කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරි ගැන්වීමේ වැඩසටහන
4. පුද්ගලික ආදර්ශන ගෙවතු ස්ථාපිත කිරීමේ වැඩසටහන
5. ජපන් යෙන් ආධාර වැඩසටහන යටතේ ලැබෙන ට්‍රැක්ටර් බෙදාහැරීම හා කළමනාකරණය
6. ගොවිජන සේවා මධ්‍යස්ථාන හරහා බීජ, රෝපණ ද්‍රව්‍ය හා කෘෂි යෙදවුම් සැපයීමේ ක්‍රියාවලිය සම්බන්ධීකරණය හා අධීක්ෂණය
7. ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමි සංවර්ධන වැඩසටහන
8. ජාතික ගොවි සතියට සමගාමීව වප්මඟුල් උත්සව ක්‍රියාත්මක කිරීම
9. දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනය

ඉහත දක්වන ලද වැඩසටහන් / ව්‍යාපෘති වල 2010 වර්ෂයේ ක්‍රියාත්මක තත්ත්වය පහත සඳහන් පරිදි සාරාංශයක් දැක්විය හැකිය.

## 2.1. කෙතට අරුණ පොහොර සහනාධාර වැඩ සටහන -2010

| කන්නය | පොහොර ලබාගත් ගොවීන් සංඛ්‍යාව | කුඹුරු අක්කර ප්‍රමාණය | නිකුත් කරන ලද පොහොර ප්‍රමාණය | | | |
|---|---|---|---|---|---|---|
| | | | යූරියා | T.S.P | M.O.P | එකතුව |
| 2009/2010 මහ | 1,100,543 | 1,568,792.07 | 164,272.13 | 52,038.63 | 47,201.41 | 263,512.18 |
| 2010 යල | 785,966 | 1,109,333.27 | 111,000.86 | 40,223.07 | 35,332.01 | 186,555.94 |
| 2010/2011 මහ | 1,114,961 | 1,841,018.58 | 175,099.91 | 58,149.12 | 51,484.06 | 284,733.10 |

මෙම වැඩසටහන ආරම්භයේ සිටම එය මෙහෙයවීමට අවශ්‍ය භෞතික හා මානව සම්පත් ඉතා සීමිතවීම දැඩි අභියෝගයක්ව ඇත. දළ වශයෙන් එක් කන්නයක් තුළ දස ලක්ෂය ඉක්මවන ගොවීන් සංඛ්‍යාවක් වෙත පොහොර බෙදාදීමට සිදුවන නමුත්, ගොවිජන සේවා මධ්‍යස්ථානවල සීමිත කාර්ය මණ්ඩලය තුළින් මෙම කාර්යය කාර්යක්ෂමව කරගැනීම දුෂ්කර වී ඇති අතර 2010 වර්ෂය තුළදීත් පොහොර බෙදාහැරීමේ ක්‍රියාවලියේ අක්‍රමිකතා වාර්තා වී ඇත.

## 2.2. තෙත් කලාපීය ප්‍රදේශ වල පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩසටහන

2010 වර්ෂය තුළ අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රතිපාදන - රුපියල් මිලියන 110

| | |
|---|---|
| ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක ගණන(අම්පාර හැර) | 24 |
| වී වගා කළ බිම් ප්‍රමාණය අක්කර | 9963 |
| ප්‍රතිලාභ හිමි වූ ගොවි පවුල් ගණන | 10822 |

(ඇමුණුම 2.1 )

## 2.3 කාබනික පොහොර නිෂ්පාදනය හා භාවිතය දිරි ගැන්වීමේ වැඩසටහන:

අමාත්‍යාංශයෙන් ලැබුණු ප්‍රතිපාදන - රු. මි. 15

| | පුහුණු කිරිමට අපේක්ෂිත | පුහුණු කළ |
|---|---|---|
| කෘ.ප.නි.ස. හා ගොවීන් සංඛ්‍යාව | 3000 | 57830 |

| | අපේක්ෂිත | ස්ථාපනය කළ |
|---|---|---|
| ගොවිජන සේවා මධ්‍යස්ථානයන්හි කාබනික පොහොර ඒකක ස්ථාපිත කිරිම | 600 | 707 |

| | | |
|---|---|---|
| නිෂ්පාදිත කාබනික පොහොර ප්‍රමාණය | 1320000 කි.ග්‍රෑ. | මෙ.ටො.1214 |

කාබනික පොහොර නිෂ්පාදනය භාවිතය දිරිගැන්වීමේ වැඩසටහන තවදුරටත් පුළුල් කරමින් 2011 වර්ෂය තුළ කාබනික පොහොර ගම්මාන ස්ථාපිත කිරීමේ වැඩසටහන සඳහා අවශ්‍ය මූලික ද්‍රව්‍ය සහ උපකරණ කට්ටල මිලට ගැනීමේ කටයුතු ද මෙම වර්ෂය තුළ සිදුකරන ලදී.

එසේම රසායනික පොහොර භාවිතය 25%ක ප්‍රමාණයක් අවම කරමින් ද එම අඩු කරන ලද ප්‍රමාණය සඳහා කාබනික පොහොර යොදමින් ද වී වගාව සඳහා යාය ආදර්ශන ඇති කිරීමේ වැඩසටහනට අනුව අනුරාධපුර දිස්ත්‍රික්කයේ විශේෂ කාබනික පොහොර වැඩසටහනක් දියත් කරන ලදී.

## 2.4 පුද්ගලික ආදර්ශන ගෙවතු ස්ථාපිත කිරීමේ වැඩසටහන

අමාත්‍යාංශ වැය ශීර්ෂය යටතේ ලැබුණු ප්‍රතිපාදන - රුපියල් 27,769,401/=

| | |
|---|---|
| දිස්. 25 තුළ ඉලක්කගත ගෙවතු ගණන | 155187 |
| ආරම්භ කළ ගෙවතු ගණන | 111964 |
| බෙදා දුන් ගෙවතු කට්ටල සංඛ්‍යාව | 95259 |
| පැවැත්වූ පුහුණු වැඩ සටහන් ගණන | 4848 |
| සහභාගි වූ සංඛ්‍යාව | 112868 |

## 2.5 ජපන් යෙන් ආධාර වැඩසටහන යටතේ ට්‍රැක්ටර් බෙදාහැරීම හා කළමනාකරණය

2KR 2008 ජපන් ආධාර ව්‍යාපෘතිය යටතේ ගොවිජන සේවා මධ්‍යස්ථාන බලප්‍රදේශ මට්ටමින් **තෝරාගත් ගොවි සංවිධාන සාමාජිකයින් වෙත** වාරික වශයෙන් අය කර ගැනීමේ පදනම මත බෙදා දුන් කෘෂි යන්ත්‍රෝපකරණ

| | |
|---|---|
| කුබෝටා වර්ගයේ රෝද 02 ට්‍රැක්ටර් (නගුල් හා අමතර කොටස් සහිතව) | 659 |
| මිට්සුබිෂි වර්ගයේ රෝද 02 ට්‍රැක්ටර් (නගුල් හා අමතර කොටස් සහිතව) | 345 |
| එන්ජිම සහිත වතුර පොම්ප | 390 |
| රෝද 4 ට්‍රැක්ටර් (ගොවිජන සේවා මධ්‍යස්ථාන සඳහා) | 35 |

ඒ අතරින්, උතුරු නැගෙනහිර පළාත්වල ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත බෙදා හරින ලද කෘෂි යන්ත්‍රෝපකරණ

| | |
|---|---|
| රෝද 04 ට්‍රැක්ටර් | 31 |
| රෝද 02 ට්‍රැක්ටර් | 396 |
| වතුර පොම්ප | 191 |

(ඇමුණුම 2.2)

මෙම ආධාර ක්‍රමය යටතේ ලද, දළ වශයෙන් රුපියල් ලක්ෂ 5ක් පමණ වන වටිනාකමකින් යුතුවන රෝද 02 ට්‍රැක්ටර්, රු.250,000/=ක් වන සහන මිලට මේ යටතේ ගොවීන් වෙත සපයා තිබේ.

එසේම පෙර වර්ෂවල මෙම ආධාර ක්‍රමය යටතේ දෙපාර්තමේන්තුව වෙත ලැබී බෙදාහරින ලද ට්‍රැක්ටර් සඳහා 2010 වර්ෂයේදී ද වාරික මුදල් අයකිරීමේ කටයුතු සිදුකරන ලද අතර, 2010 වර්ෂයේ බෙදාහරින ලද ට්‍රැක්ටර් හා වතුර පොම්ප සඳහා සඳහා ද මෙම වර්ෂයේ සිට වාරික අයවීම් කටයුතු සිදුකරන ලදී. ඒ අනුව මෙම වර්ෂය තුළ අයකර ඇති වාරික මුදල් පිළිබඳ පහත සඳහන් පරිදි වේ.

<u>රෝද 02 ට්‍රැක්ටර්</u>

| | |
|---|---|
| 1992 – 2001 දක්වා ගොවි සංවිධාන වෙත ලබාදී ඇති ට්‍රැක්ටර් සඳහා | - රු.1,210,359.00 |
| 2006 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | - රු.2,463,234.00 |
| 2008 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කළ ට්‍රැක්ටර් සඳහා | - රු.10,007,546.00 |
| 2010 වර්ෂයේ ගොවීන් වෙත නිකුත් කල ට්‍රැක්ටර් සඳහා | - රු.17,212,066.00 |
| එකතුව | රු.30,893,205.00 |

<u>රෝද 04 ට්‍රැක්ටර්</u>

| | |
|---|---|
| 1989 – 2001 දක්වා ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබාදී ඇති ට්‍රැක්ටර් සඳහා | - රු. 11,702,628.33 |

එසේම 2010 වර්ෂයේදී ට්‍රැක්ටර් අමතර කොටස් අලෙවියෙන් රු. 167,307.50 ක මුදලක් අයවී ඇත.

## 2.6 ගොවිජන සේවා මධ්‍යස්ථාන භූමි සංවර්ධන වැඩසටහන

මේ සඳහා වෙන් වූ මුදල රුපියල් මිලියන 09කි. මේ යටතේ බිම් සකස් කිරීම, බෝග ස්ථාපනය, පාංශු සංරක්ෂණ ක්‍රම, විශේෂිත වගා ආදර්ශන සහ සත්ත්ව පාලනය වැනි වෙනත් කටයුතු වශයෙන් ආදර්ශන සකස් කිරීම සඳහා සමස්ථයක් වශයෙන් මධ්‍යස්ථාන භූමි අතරින් ඉඩම් අක්කර 350කට ආසන්න බිම් ප්‍රමාණයක් මෙම වැඩසටහන යටතේ සශ්‍රීක භූමි බවට පත්වී ඇත. තවද, මේ සඳහා විශාල ශ්‍රමදායකත්වයක් ද සපයාගෙන තිබේ.

## 2.7 ජාතික ගොවි සතියට සමගාමීව වප්මඟුල් ක්‍රියාත්මක කිරීම

දිස්ත්‍රික්ක 25 තුලම වප් මගුල් උත්සව සංවිධානය කර පවත්වන ලදී. එම උත්සව සඳහා අවශ්‍ය වූ පිරිවැය ගොවිජන සංවර්ධන කමිටු විසින් දරන ලද අතර එම වියදම් පියවා ගැනීමට අපහසු වූ කමිටු සම්බන්ධයෙන් දිස්ත්‍රික්ක විසින් ඉදිරිපත් කරන ලද ඉල්ලීම් අනුව ගොවීන්ගේ භාරකාර අරමුදල මගින් වියදම් ප්‍රතිපූරණය කර ඇත.

## 2.8 දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශන කටයුතු

ජාතික නිදහස් දිනයට සමගාමීව 2010 වර්ෂයේදී කොළඹින් බැහැරව මහනුවර දිස්ත්‍රික්කයේ කුණ්ඩසාලේ දී පවත්වන ලද දැයට කිරුළ ජාතික සංවර්ධන ප්‍රදර්ශනයේදී පහත සඳහන් ප්‍රදර්ශන කටයුතු මගින්, පෙර වර්ෂවලදී මෙන් දිස්ත්‍රික්ක (මහනුවර, කුරුණෑගල, මාතලේ, කෑගල්ල, ගම්පහ, රත්නපුරය) සම්බන්ධ කරගනිමින් මෙම දෙපාර්තමේන්තුව මගින් ප්‍රදර්ශනාංග ඉදිරිපත් කරන ලද අතර, ප්‍රධාන කාර්යාලීය අධීක්ෂණය යටතේ මහනුවර දිස්ත්‍රික් භාර නියෝජ්‍ය කොමසාරිස් විසින් අදාළ ප්‍රදර්ශන කටයුතු මෙහෙයවන ලදී.

1. ගොවි ගෙදර හා ගෙවත්ත, ගොවිජන සේවා මධ්‍යස්ථාන ආකෘතිය, අලෙවිසැල, නාගරික ගෙවත්ත (මහනුවර දිස්ත්‍රික්කය මගින් ඉටුකරන ලදී.)
2. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ නෛතික පද්ධතිය නිරූපනය (කෑගල්ල දිස්ත්‍රික්කය මගින් ඉටුකරන ලදී.)
3. පාංශු පරීක්ෂණ කටයුතු නිරූපනය (ගම්පහ දිස්ත්‍රික්කය මගින් ඉටුකරන ලදී.)
4. "කමත" සජීවී රංගනය හා කමත් යාන්ත්‍රණය නිර්මාණය (රත්නපුර දිස්ත්‍රික්කය මගින් ඉටුකරන ලදී.)

# 3. සංවර්ධන හා ප්‍රගති පාලන අංශය

## 3.1 ගොඩනැගිලි ඉදිකිරීම හා පුනරුත්තාපනය (ගොවිජන සේවා මධ්‍යස්ථාන)

ගොවිජන සේවා මධ්‍යස්ථාන පුනරුත්තාපනය සඳහා රු.මිලි. 40 ක් වෙන් කර තිබූ අතර ගම්පහ, මහනුවර, හම්බන්තොට, බදුල්ල, අනුරාධපුර, කළුතර, මාතලේ, පොළොන්නරුව, මඩකලපුව, වව්නියා දිස්ත්‍රික්ක වලට අදාල මධ්‍යස්ථාන අලුත්වැඩියා අවිච්ඡේද කර්මාන්ත 12 සහ නව කර්මාන්ත 39 කටයුතු ඉටුකර ඇත. ඒ සඳහා රු.මි. 39.6 ක වියදමක් දරා ඇත. (ඇමුණුම 3.2)

## 3.2 ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල වල අලුත්වැඩියාවන්

මේ වැය ශීර්ෂය යටතේ වෙන්ව තිබූ මිලියන රු.මි.15ක මුදලින් ප්‍රධාන කාර්යාලයේ අලුත්වැඩියා කටයුතු, නාරාහේන්පිට ගබඩා සංකීර්ණය අලුත්වැඩියා කිරීම හා ත්‍රිකුණාමලය, මඩකලපුව, අම්පාර, මාතලේ, අනුරාධපුරය, පොළොන්නරුව, නුවරඑළිය, ගම්පහ, කෑගල්ල, කුරුණෑගල, මඩකලපුව, කොළඹ, බදුල්ල, මහනුවර, රත්නපුර දිස්ත්‍රික් කාර්යාල වල අලුත්වැඩියාවන් සිදු කර ඇත. මේ සඳහා රු.මි. 14.9 ක් වියදම් දරා ඇත. (ඇමුණුම 3.1)

## 3.3 ගොවිජන සේවා මධ්‍යස්ථාන නව ඉදිකිරීම්

මේ සඳහා රු.මි. 20 ක ප්‍රතිපාදන මුදලක් වෙන් වී ඇත. වර්ෂය තුල රු.මි. 14.8 ක වියදමක් මේ සඳහා දරා ඇත. මාතර දිස්ත්‍රික්කයේ සුනාමියෙන් හානියට පත් තලල්ල ගොවිජන සේවා මධ්‍යස්ථානයේ ඉදිකිරීම් කටයුතු සිදු කරමින් පවතී. රත්නපුර දිස්ත්‍රික්කයේ කල්තොට ගො.සේ.ම ඉදිකිරීම හා බදුල්ල දිස්ත්‍රික්කයේ රඹුක්පොත ගො.සේ.ම ඉදිකිරීම සිදු කර ඇත. ප්‍රධාන කාර්යාලය හා බදුල්ල, කොළඹ දිස්ත්‍රික්කයන්හි ගො.සේ. මධ්‍යස්ථානවල සුළු ඉදිකිරීම් කටයුතු කර ඇත. (ඇමුණුම 3.2)

## 3.4 කාර්යාල උපකරණ හා වෙනත් ගෘහ භාණ්ඩ

කාර්යාල උපකරණ හා වෙනත් ගෘහ භාණ්ඩ සඳහා රු.මි 22 ක් 2010 වසර සඳහා වෙන් විය. මෙය යොදවා ප්‍රධාන වශයෙන් කාර්යාල ලී බඩු, පරිගණක යන්ත්‍ර, ප්‍රින්ටර්, UPS, ආපන ශාලා උපකරණ (ප්‍රධාන කාර්යාලය සඳහා) ඡායා පිටපත් යන්ත්‍ර, විදුලි පංකා, රෝනියෝ මැෂින්, ෆැක්ස් මැෂින්, සේප්පු ආදිය මිලට ගෙන ඇත. මේ සඳහා රු.මි. 21.7 ක වියදමක් දරා ඇත. (ඇමුණුම 3.1 හා 3.2)

## 3.5 පොහොර ගබඩා ඉදිකිරීම

වැය ශීර්ෂය 281-2-2-8-2104 යටතේ පොහොර ගබඩා ඉදිකිරීම සඳහා මිලියන 60ක් වෙන්කර ඇත.

දිස්ත්‍රික්ක 12 ක නව ඉදිකිරීම් 28 ක් සිදු කොට ඇති අතර දිස්ත්‍රික්ක 08ක අවිච්ඡේද කර්මාන්ත 15 ක් සඳහා ගෙවීම් කර ඇත. මුළු වියදම රු.මි. 59.6කි. (ඇමුණුම 3.2)

අවිච්ඡේද කර්මාන්ත සියල්ලම සහ නව කර්මාන්ත 24ක වැඩ අවසන් වී ඇත.

**පොහාර ගබඩා ඉදිකිරීම - 2010-12-31 ප්‍රගතිය**

වැය ශීර්ෂ 281/2/2/8/2104

වෙන්කරන ලද ප්‍රතිපාදන රු.මිලියන 60කි.

| | දිස්ත්‍රික්කය | කර්මාන්ත ගණන | භෞතික ප්‍රගතිය % |
|---|---|---|---|
| 1 | ගම්පහ | 1 | 50-74 % |
| 2 | කළුතර | 1 | 0-24% |
| 3 | මහනුවර | 1 | 100% |
| 4 | නුවරඑළිය | 5 | 100% |
| 5 | හම්බන්තොට | 3 | 100% |
| 6 | කුරුණෑගල | 5 | 100% |
| 7 | අනුරාධපුර | 3 | 100% |
| 8 | බදුල්ල | 3 | 100% |
| 9 | ත්‍රිකුණාමලය | 2 | 100% |
| 10 | මොණරාගල | 2 | 100% |
| 11 | මඩකලපුව | 1 | 0-24% |
| 12 | යාපනය | 1 | 0-24% |
| 13 | හලාවත * | 4 | 100% |
| 14 | රත්නපුර * | 2 | 100% |
| 15 | අම්පාර * | 1 | 100% |
| 16 | මාතලේ * | 2 | 100% |
| 17 | ගාල්ල * | 2 | 100% |
| 18 | කෑගල්ල * | 1 | 100% |
| 19 | මාතර * | 1 | 100% |
| 20 | පොළොන්නරුව * | 2 | 100% |
| | | **43** | |

නව කර්මාන්ත = 28කි

* අවිච්ඡේද කර්මාන්ත = 15කි

## 3.6 සුළු වාරිමාර්ග පුනරුත්තාපනය

මෙම දෙපාර්තමේන්තුව ආරම්භයේදී සිටම සුලු වාරිමාර්ග පුනරුත්තාපනය මෙම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයක් විය. 2000 ග්‍රාමීය වාරිමාර්ග සමීක්ෂණයට අනුව ශ්‍රී ලංකාව පුරා වැව් 11257 ක්ද අමුණු 12942 ක්ද ඇත. මෙයට සම්බන්ධ වාරිමාර්ග ප්‍රමාණය අති විශාලය. වී වගා කරන ගොවීන් වෙනුවෙන් මේවා නඩත්තු කිරීම, ප්‍රතිසංස්කරණය ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව පසුගිය වර්ෂ 50ක කාලය තුල ඉටුකරන ලදි. එහෙත් 2009 වර්ෂයේ සිට ඒ වෙනුවෙන් ප්‍රතිපාදන වෙන්කිරීම මහ භාණ්ඩාගාරය විසින් නවත්වන ලදි. පලපුරුදු ඉංජිනේරු හා තාක්ෂණ නිලධාරී කාර්ය මණ්ඩලයක් හා ජල කලමනාකරණ අංශයක් සතු මෙම දෙපාර්තමේන්තුවට මෙම වැය ශීර්ෂය නොමැතිවීම මහත් අභියෝගයක් විය. මෙම කටයුතු ඉටු කිරීම පිළිබඳ ගැටළුව ජනාධිපති ලේකම් කාර්යාලයේදී සාකච්ඡා කරන ලදුව ඊට පිළියමක් වශයෙන් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ප්‍රතිපාදන ලබාගෙන එම කටයුතු කිරීම ආරම්භ කරන ලදි. ඒ අනුව ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් රු.මි. 220.29 ක් ලබා ගෙන 194.29 ක වියදමින් කර්මාන්ත 665ක් ඉටු කරන ලදී.

මීට අමතරව දිස්ත්‍රික් ලේකම්වරු මඟින් ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයෙන් ලද මිලියන 308.56 ක ප්‍රතිපාදන යටතේ කර්මාන්ත 581 ක් රු.මි. 268.84 ක වියදමක් දරා ඉටුකර ඇත.

**ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය 2010**

| අංකය | දිස්ත්‍රික්කය | ලැබුණු ප්‍රතිපාදනය රු.මිලි | කර්මාන්ත ගණන | වියදම |
|---|---|---|---|---|
| 1 | මහනුවර | 50.00 | 212 | 48.60 |
| 2 | බදුල්ල | 05.00 | 81 | 00.36 |
| 3 | කෑගල්ල | 29.01 | 111 | 29.01 |
| 4 | අනුරාධපුර | 29.00 | 47 | 27.00 |
| 5 | මාතලේ | 58.43 | 109 | 54.11 |
| 6 | ගම්පහ | 23.79 | 75 | 16.26 |
| 7 | කුරුණෑගල | 00.98 | 01 | 00.19 |
| 8 | නුවරඑළිය | 10.70 | 20 | 10.70 |
| 9 | වවුනියාව | 13.38 | 09 | 08.06 |
| | **එකතුව** | **220.29** | **665** | **194.29** |

**දිස්ත්‍රික් ලේකම්වරුන් හරහා ලැබුණු ප්‍රතිපාදන**

| අංකය | දිස්ත්‍රික්කය | ලැබුණු ප්‍රතිපාදනය රු.මිලි | කර්මාන්ත ගණන | වියදම රු.මිලි |
|---|---|---|---|---|
| 1 | පොළොන්නරුව | 19.00 | 23 | 10.88 |
| 2 | හම්බන්තොට | | 42 | 21.50 |
| 3 | මාතර | 03.90 | 01 | 03.90 |
| 4 | කුරුණෑගල | 15.00 | 149 | 14.65 |
| 5 | මන්නාරම | 117.80 | 27 | 86.40 |
| 6 | පුත්තලම | 15.00 | 149 | 14.65 |
| 7 | කළුතර | 05.52 | 24 | 04.70 |
| 8 | රත්නපුරය | 02.00 | 06 | 01.38 |
| 9 | මොණරාගල | 04.80 | 11 | 04.30 |
| 10 | අම්පාර | 09.39 | 10 | 07.25 |
| 11 | කොළඹ | 12.37 | 85 | 12.37 |
| 12 | යාපනය | 23.31 | 16 | 22.51 |
| 13 | කිළිනොච්චිය | 59.59 | 30 | 59.59 |
| 14 | වව්නියාව | 20.88 | 08 | 04.76 |
| | **උප එකතුව** | **308.56** | **581** | **268.84** |

(ඇමුණුම 3.3)

## 3.7 බාහිර ආයතන සමඟ කටයුතු

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ අයවැය ප්‍රතිපාදන යටතේ සංවර්ධන කාර්යන්ට ලැබෙන මුදල් සහ අමාත්‍යාංශයේ වැය ශීර්ෂය යටතේ ලැබෙන අරමුදල් වලට බාහිරව විවිධ ව්‍යාපෘති හා රාජ්‍ය නොවන සංවිධානද පළාත් සභා ප්‍රතිපාදන යටතේද කර්මාන්ත 153 ක් නිමකර ඇති අතර, එම වැඩවල වටිනාකම මිලියන 263.48 කි.

**සුළු වාරිමාර්ග ප්‍රතිසංස්කරණය**
**(උතුරු නැගෙනහිර පුනරුත්ථාපන ව්‍යාපෘතිය යටතේ)**

| | දිස්ත්‍රික්කය | මූල්‍ය ප්‍රතිපාදන සපයන ආයතනය | කර්මාන්ත සංඛ්‍යාව | ප්‍රතිපාදන මුදල මිලි. |
|---|---|---|---|---|
| 1 | වව්නියා | ENREP<br>NGO<br>PSDG<br>Uthuru wasanthaya | 29<br>26<br>01<br>08 | 64.70<br>දන්වා නැත<br>5.10<br>6.10 |
| 2 | මුලතිව් | ENREP | 43 | 86.28 |
| 3 | යාපනය | ENREP | 16 | 21.90 |
| 4 | මන්නාරම | ENREP | 20 | 69.40 |
| 5 | කිළිනොච්චි | ගොවිභාරකාර අරමුදල | 10 | 10 |
| | | | **153** | **263.48** |

## 3.8 අලුත් සහල් මංගල්‍යය ( 2010 අප්‍රේල් 01 – 02)

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව වාර්ෂිකව පවත්වා ගෙන එන අලුත් සහල් මංගල්‍යය 43 වන වරටත් අනුරාධපුර විජය ශ්‍රී ජය ශ්‍රී මහ බෝධිය ඉදිරිපිට 2010 අප්‍රේල් 01 හා 02 දිනයන්හී පවත්වන ලදි.

හතර වාහල් කඩ කිරි ඉතිරිවීමේ සිට අලුත් සහල් පෙරහැර ශ්‍රී මහ බෝධීන් වහන්සේ අභියසට පැමිණ පූජා කිරීම දක්වා කටයුතු සජීවීව ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාව මගින් හා ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව මගින් ප්‍රචාරය කිරීම මෙවරද සිදු විය. රූපවාහිනී ප්‍රචාරය සඳහා ලංකා බැංකුව වියදම දරන ලදි.

මෙවර අලුත් සහල් මංගල්‍යයේදී මී පැණි පූජාව හා ගිතෙල් පූජාවද සිදු කරන ලදි. ආදිවාසී කණ්ඩායම මී පැණි පූජාව පවත්වන ලද අතර රත්නපුර මහ සමන් දේවාලයේ බස්නායක නිලමේ විසින ගිතෙල් සැපයීම කරන ලදි. කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍ය මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ඇතුලු මැති ඇමතිවරුන්ද, රාජ්‍ය නිළධාරීන්ද මෙම උත්සවයට සහභාගී වූහ.

දිවයිනේ සියලුම ගොවිජන සේවා මධ්‍යස්ථාන වලින් එක්රැස් කර බාරදුන් සහල් මෙදින පූජාකරණ ලදි. සහල් හා මුදල් ආධාර සැපයීම දිවයින පුරා පිහිටි ගොවි සංවිධාන විසින් කරන ලදි.

මෙම අලුත් සහල් මංගල්‍යය සාර්ථක කර ගැනීමට කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යාංශය යටතේ ඇති සියළුම ආයතන හා උතුරුමැද පළාත් සභාව සහයෝගය දක්වන ලදි. ජන වාර්ගික යුදුධයේ ඉතා බැරෑරුම් අවස්ථාවක පවත්වන ලද මෙම උත්සවය දැඩි ආරක්ෂක විධි විධාන මධ්‍යයේ පවැත්වූවද අධික පිරිසක් උත්සවය සඳහා සහභාගී වූහ. පිරිත හා දානය පිළිබඳ සියලු කටයුතු අනුරාධපුර ගොවිජන සේවා කාර්යාලයේ මූලිකත්වයෙන් ඉටු කරන ලදි. දිවයිනේ ප්‍රවීන ලේඛකයන්ගේ ලිපි ඇතුලත් 'අලුත් සහල් මංගල්‍යය' පොතද සමරු කලාපයක් වශයෙන් නිකුත් කරන ලදි.

## 3.9 යාන්ත්‍රික සේවා සැපයීම
## දෙපාර්තමේන්තුව සතු ඩෝසර් / එක්ස්කැවේටර් යන්ත්‍ර

සංවර්ධන හා ප්‍රගති පාලන අංශය සම්බන්ධව කටයුතු කරන යාන්ත්‍රික අංශය යාන්ත්‍රික අධිකාරිවරයෙකුගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වේ.

දැනට අප දෙපාර්තමේන්තුව සතු යන්ත්‍ර 20 ක් පහත දැක්වෙන වර්ෂ වලදී "ජපන් යෙන්" ප්‍රදානය යටතේ ලැබී ඇත. තවද, 2009 වර්ෂය අවසානයේදී භාණ්ඩාගාර ප්‍රතිපාදන වලින් මිනි එක්ස්කැවේටර් /පොන්ටූන් යන්ත්‍රයක් ද ලබාගෙන ඇත.

| වර්ෂය - | 1983 | 1984 | 1985 | 1986 | 1990 | 1994 | 1997 | 1999 | 2009 | එකතුව |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| යන්ත්‍ර - සංඛ්‍යාව | 01 | 01 | 06 | 02 | 02 | 05 | 01 | 02 | 01 | = 21 |

එසේ ලැබී ඇති ඒවායින් දැනට එක් ඩෝසර් යන්ත්‍රයක් ද, ට්‍රැක් ෂවල් යන්ත්‍රයක්ද අබලන් තත්වය මත සේවයෙන් ඉවත් කර අපහරණය කිරීමට කටයුතු කර ඇති අතර දැනට ඉතිරිව ඇති යන්ත්‍ර 19 පහත පරිදි වේ.

1. ඩෝසර් යන්ත්‍ර - **14**
2. එක්ස්කැවේටර් යන්ත්‍ර - **04**
3. මිනි එක්ස්කැවේටර් /පොන්ටූන් යන්ත්‍ර - **01**

**19**

2009 වර්ෂයේදී මිලට ගෙන ඇති පොන්ටූන් යන්ත්‍රය හැර අනිකුත් යන්ත්‍ර සියල්ලක්ම පාහේ දැනටමත් සේවා පැය 10,000 සීමාව පසු කර ඇති අතර, භාවිතා කළ වර්ෂ ගණනාව අනුවද **යන්ත්‍ර වල සම්පූර්ණ ආයු කාලය** ඉකුත්වී ඇති බව ඉහත අනුව පැහැදිලි වනු ඇත.

එනමුත් ඉතා දැඩි කැපවීමකින් යුතුව, මනා පරිශ්‍රමයකින් හා පාලනයකින් යුතුව නඩත්තු කර ඇති බැවින් මේවායින් **වැඩි ප්‍රමාණයක් තවමත් හොඳම යාන්ත්‍රික තත්වයෙන්** යුතුව තවදුරටත් නඩත්තු කරගෙන යාමට හැකිවී ඇත. යන්ත්‍ර නඩත්තුව සඳහා 2010 වර්ෂයට වෙන් කර තිබූ ප්‍රතිපාදනය **රු.මිලි 10** ක් වන අතර එම ප්‍රමාණය මෙවැනි එක් යන්ත්‍රයක නව වෙළඳ පොල වටිනාකමටත් වඩා අඩු මුදලකි. **( මෙවැනි යන්ත්‍රයක නව වටිනාකම රු.මිලියන 12-15 අතර ප්‍රමාණයක් වේ.)**

**<u>2010 දී දෙපාර්තමේන්තු ඩෝසර් / එක්ස්කැවේටර් යන්ත්‍ර දැනට ක්‍රියාත්මක වූ දිස්ත්‍රික්ක</u>**

| දිස්ත්‍රික්කය | | යන්ත්‍ර ප්‍රමාණය |
|---|---|---|
| 1. හම්බන්තොට | - | **05** |
| 2. මොණරාගල | - | **05** |
| 3. කුරුණෑගල | - | **05** |
| 4. අනුරාධපුරය | - | **01** |
| 5. කෑගල්ල | - | **01** |
| 6. කොළඹ | - | **02** |
| | | **19** |

එම යන්ත්‍රෝපකරණ ඉතා සහනදායී මිලකට ගොවි ජනතාව වෙත ලබාදීමට කටයුතු කරන අතර එම මිල යන්ත්‍ර සේවා පැයකට රු. 500/= සිට රු.750/= ක් පමණ වේ. (සාමාන්‍යයෙන් මෙවැනි යන්ත්‍රයක් සේවා පැයකට අය කරනු ලබන වෙළඳ පොල වටිනාකම **රු. 3000/= සිට රු. 3250/=** දක්වා වේ.) එලෙස ගොවි ජනතාව වෙත සේවා සිදු නොකරන විටකදී වෙනත් රජයේ කෘෂි/වාරිමාර්ග සංවර්ධන වැඩ සටහන් වලට ද යොදවනු ලබන අතර එවිටද රජයේ ගාස්තුවක් ලෙස අයකරනු ලබන්නේද රු.750/= (උපරිමය) ගාස්තුවක් වේ.

ඉතා දුර බැහැර අති දුෂ්කර තත්වයන් යටතේ හා වෙනත් යන්ත්‍රෝපකරණ නොමැති තත්වයන් යටතේ සේවා අවශ්‍යතාවය මත ගොවි ජනතාව වෙත උපරිම අයුරකින් සේවයේ යොදවනු ලබන මෙම යන්ත්‍ර මගින් 2010 වර්ෂයේදී රජයට ලබාදී ඇති සහනදායී පදනම යටතේ උපායාගත් ආදායම **රු.3,910,251.01** කි. නොයෙක් මූල්‍ය හේතූන් හා ප්‍රතිපාදන ලැබී තිබුණත් මුදල් ලැබීමට සිදුවූ ප්‍රමාදයන් නිසා අදාල දිස්ත්‍රික්ක වලින් තවදුරටත් ආදායම ලැබීමටත් ඇති බව පෙනී යයි.

එනම් ආසන්න වශයෙන් ඉහත කී දැනට ලැබී ඇති ආදායමට අනුව යන්ත්‍ර වල සේවා පැය 5214 ක් ක්‍රියාකාර ඇතැයි උපකල්පනය කළහොත් යන්ත්‍ර ක්‍රියාකරවීමෙන් රටට අත් කර දී ඇති සංවර්ධන වැඩවල වටිනාකම රු.3250.00 X 5214 = **<u>රු.16,945,500,000</u>** ක් පමණ වනු ඇත. එනම් රු. මිලියන 16 කට අධික මුදලකි.

මෙවැනි විශාල වටිනාකමැති සංවර්ධන කටයුතු ඉටුකරන ලද යන්ත්‍ර, අලුත්වැඩියාව සහ නඩත්තුව වෙනුවෙන් 2010 වර්ෂයේදී වැය කර ඇති මුදල **<u>රු.8,982,668.81</u>** කි. එනම් රු. මිලියන 9 කට ආසන්න මුදලකි.

එම මුදල වැය කරන ලද ආකාරය පහත ඉදිරිපත් කර ඇත

**<u>2010 වර්ෂයේ ඩොසර්/එක්ස්කැවේටර් යන්ත්‍ර අලුත්වැඩියාවන් සඳහා සිදුකර ඇති වියදම්</u>**

| | | | |
|---|---|---|---|
| | | | <u>රු.</u> |
| **1.** | DAS 17 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 1037,137.22 |
| **2.** | DAS 26 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 53,950.40 |
| **3.** | DAS 27 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | වියදම් කර නැත |
| **4.** | DAS 28 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 202,510.56 |
| **5.** | DAS 29 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 180,000.00 |
| **6.** | DAS 30 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 622,616.74 |
| **7.** | DAS 31 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | වියදම් කර නැත |
| **8.** | DAS 34 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | වියදම් කර නැත |
| **9.** | DAS 45 එක්ස්කැවේටර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 652,070.72 |
| **10.** | DAS 46 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 351,998.08 |
| **11.** | DAS 48 එක්ස්කැවේටර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 182,140.00 |
| **12.** | DAS 49 එක්ස්කැවේටර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 283,920.00 |
| **13.** | DAS 50 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 745,634.97 |
| **14.** | DAS 51 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 1,445,099.49 |
| **15.** | DAS 52 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 73,158.40 |
| **16.** | DAS 53 එක්ස්කැවේටර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 477,852.55 |
| **17.** | DAS 54 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 301,088.48 |
| **18.** | DAS 55 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 2,351,129.76 |
| **19.** | DAS 70 ඩෝසර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීම | - | 22,361.44 |

තවද, පුරන් කුඹුරු අස්වැද්දීමේ වැඩ සටහන යටතේ මුහුදු බඩ ප්‍රදේශ වල හා තෙත් කලාපීය වගා බිම්වල ඇල මාර්ග ප්‍රතිසංස්කරණය සඳහා අත්‍යාවශ්‍යව තිබූ **පොන්ටූන් බාජ් එකක් සහිත මිනි එක්ස්කැවේටර් යන්ත්‍රයක්** ද 2009 ප්‍රතිපාදන වලින් රු.මිලියන 12 ක පමණ මුදලකට මිලට ගැනීමට කටයුතු කරන ලදි. මෙම යන්ත්‍රය 2010 සංවර්ධන වැඩ සටහන් යටතේ හෝමාගම මුත්තැස්ස ඇල සංවර්ධනය සඳහා යොදවාගත් අතර එමගින් මුත්තැස්ස වෙල්යාය නැවත අස්වැද්දීමට පියවර ගෙන ඇත.2010 ජාතික වප්මඟුල් උත්සවය පවත්වන ලද්දේද, මුත්තැස්ස වෙල්යායේදීය.

**2010 වර්ෂයේ ලැබී ඇති ආදායම**

| | | | |
|---|---|---|---|
| 1. | හම්බන්තොට දිස්ත්‍රික් කාර්යාලය | - | රු.1,170,750.00 |
| 2. | මොණරාගල දිස්ත්‍රික් කාර්යාලය | - | රු. 315,750.00 |
| 3. | කුරුණෑගල දිස්ත්‍රික් කාර්යාලය | - | රු.1,971,000.00 |
| 4. | අනුරාධපුර දිස්ත්‍රික් කාර්යාලය | - | රු. 316,775.00 |
| 5. | කිලිනොච්චිය දිස්ත්‍රික් කාර්යාලය | - | රු. 135,976.01 |
| | | | රු. 3,910,251.01 |

# 4. ජල කළමනාකරණ අංශය

මෙම දෙපාර්තමේන්තුවේ ජල කළමනාකරණ අංශය 1981 වර්ෂයේ ආරම්භ කරන ලදී. දැනට එය ජල කළමනාකරණය පිළිබඳ ඉංජිනේරු වරයෙකුගේ ප්‍රධානත්වයෙන් ක්‍රියාත්මක වේ. මෙම අංශය ආරම්භ කළේ අත්හැර දමා ඇති වැව් පුනරුත්ථාපනය කිරීමෙන් හා ක්‍රියාත්මක වැව් නවීකරණය කිරිමෙන් ද එසේම එම වැව් වල ක්‍රමානුකූල ජල පාලන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමෙන් කෘෂිකර්ම නිෂ්පාදනය වැඩි කිරීමටයි. ඒ සඳහා ක්‍රමවත් ජල පාලන වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම කාර්මික නිලධාරීන් හා අනෙකුත් නිළධාරීන් පුහුණු කිරීම ජල පාලන අංශයට පැවරී තිබෙන ප්‍රධාන කාර්යයකි. ඊට අමතරව පහත දැක්වෙන කාර්යයන් 2010 වර්ෂය තුල ඉටුකර ඇත.

**<u>2010 වර්ෂයේ ජල කළමනාකරණ අංශය මඟින් ඉටුකරන ලද කාර්යයන්</u>**

දැනට තිබෙන මානව සම්පත්

- ඉංජිනේරු 01
- ජ්‍යෙෂ්ඨ ඉංජිනේරු සහකාර 02
- කෘෂිකර්ම මෙහෙයුම් නිලධාරී 02
- රාජ්‍ය කළමනාකරණ සහකාර 03
- කාර්යාල කාරක සහායක 01

## ඉටුකරන ලද කාර්යයන්

### 01. තත්ව පාලන කටයුතු ( පාංශු පරීක්ෂණ කටයුතු)

දිස්ත්‍රික්ක ගණන 08
වැව් සංඛ්‍යාව 40

### 02. ජල කළමනාකරණ නියමු ව්‍යාපෘතිය

දිස්ත්‍රික්ක ගණන 09
කර්මාන්ත ගණන 20
(වැව් ආශ්‍රිත වර්ෂාපතනය, වාෂ්පීකරණය, කුඹුරු වලට ජලය ලබාදෙන ප්‍රමාණය, කාලගුණික දත්ත ආදිය ලබාගැනීම)

### 03. ගම්බද වාරිමාර්ග යටතේ ජල ප්‍රමිතිය පරීක්ෂා කිරීම

ගම්බද වාරිමාර්ග වල ජල ප්‍රමිතිය පරීක්ෂා කර වගා කටයුතු සඳහා ජලයේ ගුණත්වය පිළිබඳ අධ්‍යයනය කිරීමේ සමීක්ෂණ වැඩ සටහනක් දිවයිනෙහි සියළු දිස්ත්‍රික්ක ආවරණය වන පරිදි ආරම්භ කර ඇත.

### 04. ගම්බද වාරිමාර්ග දත්ත පොත් මුද්‍රණය කිරීම

ගම්බද වාරිමාර්ග පිළිබඳ විස්තර ඇතුලත් දත්ත පොතක් මුද්‍රණය කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කෙරෙමින් පවතින අතර, මෙම පොත සඳහා ඇතුලත් කිරීමට නියමිත ග්‍රාමීය වාරිමාර්ග විස්තර ඇතුලත් සිතියම් සංස්කරණය කර මුද්‍රණය කිරීම.

### 05. වර්ෂාපතන මාන දිස්ත්‍රික් මට්ටමින් ස්ථාපිත කිරීම

2010 වර්ෂය තුල වර්ෂාපතන මාන 135 ක් ගොවිජන සේවා මධ්‍යස්ථාන වෙත ලබා දීමට කටයුතු කර ඇත.

## 06. වාරි මාර්ග දත්තපාදම නිර්මාණ කටයුතු

- දිස්ත්‍රික්ක ගණන : 23 (දිස්ත්‍රික්ක වල පිහිටි වැව්, අමුණු ප්‍රමාණ පිළිබඳව සමීක්ෂණය කිරීම)
- සුළු වාරි මාර්ග දත්ත පාදමට අදාල මෘදුකාංගය මේ වන විට නිර්මාණය කර අවසන් වී ඇති අතර, එහි පරීක්ෂා කිරීම් කටයුතු සිදු කිරීම.

## 07. UNDP ආධාර

UNDP/DMC ආධාර යටතේ මොණරාගල දිස්ත්‍රික්කයේ කිඳලිය වැව අදියර I ප්‍රතිසංස්කරණ කටයුතු ආරම්භ කිරීම.

## 08. බටඅත වැව ඉදි කිරීම

කෘෂිකර්ම දෙපාර්තමේන්තුවේ මූලා‍ ප්‍රතිපාදන යටතේ හම්බන්තොට දිස්ත්‍රික්කයේ බටඅත වැව අදියර I ඉදි කිරීම් කටයුතු ආරම්භ කිරීම.

## 09. පොත් මුද්‍රණය කිරීම

- ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ස්ථාපිත කරන ලද වර්ෂාපතනමාන වල පාඨාංක සටහන් කිරීම සඳහා වර්ෂාපතන දත්ත පාඨාංක පොත් 700 මුද්‍රණය කර දිස්ත්‍රික්ක වෙත බෙදා දීමට කටයුතු කිරීම.
- වියළි කලාපයේ වැව් වල ජල උස මැනීම සඳහා ස්ථාපිත කරන ලද ජලඋස මාපක වල පාඨාංක සටහන් කිරීම සඳහා වැවේ ජල උස මනින පාඨාංක පොත් 2000ක් ( සිංහල හා දෙමළ භාෂාවෙන්) මුද්‍රණය කර දිස්ත්‍රික්ක වෙත බෙදා දීමට කටයුතු කිරීම.

## 10. පුහුණු වැඩසටහන්

- මෙම අංශය මගින් නිර්මාණය කරන ලද වාරි මාර්ග දත්ත පාදම සහ කුඹුරු නාම ලේඛන දත්ත පාදම් භාවිතා කිරීම පිළිබඳ දිස්ත්‍රික් කාර්යාල නිලධාරීන් පුහුණු කිරීම.
- දෙපාර්තමේන්තුවේ නවක කාර්මික නිලධාරීන් සඳහා අධිතාක්ෂණික මිනුම් උපකරණ භාවිතය පිළිබඳ පුහුණු වැඩ මුළුවක් පැවැත්වීම සහ වව්නියා දිස්ත්‍රික්කයේ ග්‍රාමීය වැව් ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ ප්‍රායෝගික පුහුණුවක් ලබා දීම.
- දෙපාර්තමේන්තුවේ නවක කාර්මික නිලධාරීන් සඳහා ජල කළමනාකරණ කටයුතු පිළිබඳ පුහුණුවක් ලබා දීම.

# 5. නීති අංශය

ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ඉඩම් වලින් ප්‍රශස්ත ඵලදායිතාවක් ලබා ගනිමින් ශ්‍රී ලාංකීය ගොවි ජනතාව තිරසාර සංවර්ධනයක් සඳහා රැගෙන යාමේ ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ දර්ශනය මුදුන්පත් කරලීම සඳහා පහත සඳහන් ආකාරයෙන් නීති අංශය එම මෙහෙවරට දායක වේ.

1. ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිය සැකසීමට ගොවිජන නීතිය, ඊට අදාල රීති සකස් කිරීම සඳහා අවශ්‍ය තොරතුරු අමාත්‍යාංශය වෙත ලබා දීම හා සහාය වීම.
2. අද ගොවීන් හා ඉඩම් හිමියන් අතර ඇති වන කෘෂිකාර්මික ආරවුල් විසඳීම සඳහා වන නෛතික මගපෙන්වීම.
3. වගා අයිතිවාසිකම් ආරක්ෂා කර දීම.
4. ග්‍රාමීය වාරිකර්මාන්ත ආරක්ෂා කිරීම හා වගා රීති ක්‍රියාත්මක කිරීමට අදාල නීතිමය රැකවරණය සැලසීම.
5. දෙපාර්තමේන්තු නිලධාරින් හා ගොවීන් ආයතන සඳහා නීතිමය උපදේශනය
6. ගොවිජන නීතිය බලගැන්වීම සඳහා අධිකරණමය කාර්යයන්හි නිරත වීම.

## 5.1 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීමේ කාර්යය.

2006 වර්ෂයේ සිට මෙම කාර්යය ක්‍රියාත්මක කරන අතර, ගොවි නියෝජිත ආයතන ඇතුලු මහජනතාවගේ අදහස් හෝ යෝජනා ලබා ගෙන විමර්ශණයට ලක් කරමින් නව පනත් කෙටුම්පතක් සම්පාදනය කිරීමේ කටයුතු සිදු කරමින් පවතී.

දැනට ක්‍රියාත්මක වන 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන නියෝග පනවා නැති අතර කාලීනව ඉතාමත් වැදගත් වන කෘෂිකාර්මික ඉඩම් කාර්යක්ෂමව වගා කිරීම සඳහා වන පනතේ 22,23, 25 සහ 26 වගන්ති ක්‍රියාත්මක කිරීම සඳහා වන නියෝග සකස් කොට පාර්ලිමේන්තුවේ සම්මත කිරීමට අවශ්‍යව ඇති හෙයින් ඒ සඳහා වන නියෝග කෙටුම්පත් කිරීම ආරම්භ කර ඇත.

## 5.2. ගොවි ආරවුල් විසඳීම.

අද ගොවි අයිතිවාසිකම් සහ වගා අයිතිවාසිකම් සඳහා වන ඉඩම් හිමි ගොවීන් හා බුක්ති කරුවන්ට අදාල වන ගොවි ආරවුල් විසඳීම ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ මූලික කාර්යයකි.
අද ගොවීන් නෙරපීම සඳහා අදාල වන පැමිණිලි ඉඩම් හිමි ප්‍රවේණිය ගෙවීම පැහැර හැරීම සම්බන්ධව පැමිණිලි ඇතුලු ගොවිජන විනිශ්චය සභාව මගින් පරීක්ෂණ පවත්වා විසඳුම් ලබා දියයුතු යයි පනත මගින් නිගමනය කර ඇති ගොවි ආරවුල් විසඳීම පිළිබඳ ගැටලුවක් ඇත.

එනම් ගොවිජන සංවර්ධන පනතේ 39 වගන්තිය යටතේ ස්ථාපිත කළයුතු ගොවිජන විනිශ්චය සභා මේ වන තුරුත් ස්ථාපිත කර නොතිබීමයි.ඒ අනුව ලැබී ඇති පැමිණිලි දිස්ත්‍රික් කාර්යාල වල ලේඛන ගත කොට තබා ඇති අතර, විනිශ්චය සභා ස්ථාපිත කිරීමෙන් පසුව පරීක්ෂණ සඳහා යොමු කිරීමට නියමිතය.

ගොවිජන විනිශ්චය සභාව වෙත යොමු කිරීමට තබා ඇති ඉල්ලීම් සංඛ්‍යාව 2010 වර්ෂය දක්වා පහත සඳහන් ආකාරයෙන් වර්ධනය වී ඇත.

| වර්ෂය | ඉල්ලීම් සංඛ්‍යාව |
|---|---|
| 2004 | 660 |
| 2005 | 1151 |
| 2006 | 2327 |
| 2007 | 3422 |
| 2008 | 3510 |
| 2009 | 3945 |
| 2010 | 4285 |

## 5.3 ගොවි පැමිණිලි (පොදු).

ගොවිජන සංවර්ධන පනත යටතේ ලැබී ඇති පැමිණිලි.

| 2010 වර්ෂය තුල ලැබීම් | 2010.01.01 දිනට ඉතිරි | 2010 වර්ෂය තුල විසඳීම් | 2010.12.31දිනට ඉතිරි |
|---|---|---|---|
| 12799 | 532 | 11209 | 2122 |

## 5.4. අධිකරණ කටයුතු වලට මැදිහත් වීම්

නීතිපති සහාය ලබා ගැනීමට කටයුතු කිරීම

| | | |
|---|---|---|
| ශ්‍රේෂ්ඨාධිකරණය | - | -- |
| අභියාචනාධිකරණය | - | 08 |
| මහාධිකරණය | - | 18 |
| දිසා අධිකරණය | - | 08 |
| මහේස්ත්‍රාත් අධිකරණය | - | 15 |

කුඹුරු ඉඩම් අනවසරයෙන් ගොඩ කිරීම සම්බන්ධයෙන් දිස්ත්‍රික් මට්ටමෙන් නීතිමය පියවර ගැනීම

2010 වර්ෂය තුල ප්‍රගතිය පහත දැක්වේ.

1. අනවසර ගොඩ කිරීම් /ඉදි කිරීම් සඳහා තහනම් නියෝග ලබා ගත් සංඛ්‍යාව - (33 වගන්තිය) - 357
2. වරදට දඩුවම් කිරීම හා යථා තත්ත්වයට පත් කිරීම - (33 වගන්තිය) - - 115

## 5.5 කෘෂිකාර්මික ඉඩම් ලේඛන සම්බන්ධ කාර්යයන්:

ගොවිජන සංවර්ධන පනත ක්‍රියාත්මක කිරිමේදී උක්ත පනතේ 53 වගන්තිය කෘෂිකාර්මික ඉඩම් ලේඛන සම්බන්ධයෙන් පනවා ඇති විධිවිධාන ක්‍රියාත්මක කිරීම සහ එම කටයුතු අධීක්ෂණය කිරීම වැදගත් කාර්යයකි.සෑම වර්ෂයකටම දෙවරක් දිවයිනේ ගොවිජන සේවා මධ්‍යස්ථාන වල ඇති කෘෂිකාර්මික ඉඩම් ලේඛන මහජන පරීක්ෂාව සඳහා විවෘතව තැබීමෙන් අනතුරුව ඒ පිළිබඳව ලැබෙන ඉල්ලුම්පත් පරීක්ෂා කර බලා අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීමත් ගොවිජන සේවා කාරක සභාවල වගකීමකි.උක්ත ක්‍රියාවලියේ ප්‍රගතිය පහත ඉදිරිපත් කර ඇත.

**කෘෂිකාර්මික ඉඩම් ලේඛන සංශෝධනය.**

| 2010 වර්ෂය තුල ලැබීම් | පෙර වර්ෂ වල ඉතිරි | පරීක්ෂණ කළයුතු මුලු ගණන | පරීක්ෂාකර අවසන් | ඉතිරි සංඛ්‍යාව |
|---|---|---|---|---|
| 12270 | 16549 | 28819 | 8860 | 19959 |

## 5.6. නෛතික උපදේශන කාර්යයන්.

දෙපාර්තමේන්තු නිලධාරින් වග උත්තරකරුවන් කරමින් අධිකරණයේ පවරනු ලබන නඩු සම්බන්ධයෙන් නීතිපති සහාය ලබා දීම සහ අවශ්‍ය අවස්ථාවන්හිදී අධිකරණයේ පෙනී සිටීම සිදු කරනු ලැබේ.
යම් යම් හේතූන් මත මානව හිමිකම් කොමිෂම මගින් සහනයක් අපේක්ෂා කරන්නන් සඳහා අවශ්‍ය සහාය ලබා දීම සහ පෙනී සිටීම සිදු කෙරේ.පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වෙත, මානව හිමිකම් කොමිෂම වෙත අවශ්‍ය අවස්ථාවන්හිදී පෙනී සිටීමින් කරුණු ඉදිරිපත් කිරිම සිදු කරනු ලැබේ.එහි විස්තර පහත දැක්වේ.

| | |
|---|---|
| පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස් කාර්යාලයට ඉදිරිපත් වූ පැමිණිලි (2010) | 03 |
| මානව හිමිකම් කොමිෂමට ඉදිරිපත් වූ පැමිණිලි (2010) | 01 |
| පාර්ලිමේන්තු උපදේශක කාරක සභාවට පිලිතුරු සැපයීම (2010) | - |
| මහජන පෙත්සම් කාරක සභාවට ඉදිරිපත් වූ පැමිණිලි(2010) | - |
| අල්ලස් හෝ දූෂණ විමර්ශණ කොමිෂන් සභාව (2010) | - |

# 6. ගිණුම් අංශය

## 2010 වර්ෂයේ මූල්‍ය ප්‍රගතිය

2010 මහභාණ්ඩාගාර මුද්‍රිත ඇස්තමේන්තු මඟින් මෙම දෙපාර්තමේන්තුව වෙත රු.මි. 3,038.9 ක ප්‍රතිපාදන වෙන් කර දී ඇත. එය මෙම දෙපාර්තමේන්තුවේ ක්‍රියාත්මක වැඩසටහන් 2 ක විෂයෙහි පහත පරිදි බෙදී ඇත.

පුනරාවර්ථන වියදම්

| | | |
|---|---|---|
| 281 - වැඩසටහන - 1 | රු.මි. 173.55 | |
| වැඩසටහන - 2 | රු.මි. 2,667.85 | රු.මි. 2,841.40 |

මූලධන වියදම්

| | | |
|---|---|---|
| 281 - වැඩසටහන - 1 | රු.මි. 32.00 | |
| වැඩසටහන - 2 | රු.මි. 165.00 | රු.මි. 197.50 |
| | | රු.මි. 3,038.90 |

පොදු තැන්පත් ගිණුමෙන් ලද ප්‍රතිපාදනය රු.මි. 18.64

මූලධන ප්‍රතිපාදන සංවර්ධන කාර්යයන් වල යෙදවී ඇති අයුරු

| ක්ෂෙත්‍රය | අනුමත වැය ශීර්ෂය (රු.මි) | තැන්පත් ගිණුම (රු.මි) | එකතුව (රු.මි) |
|---|---|---|---|
| 1. දිස්ත්‍රික් කාර්යාල හා ගොවිජන සේවා මධ්‍යස්ථාන අලුත්වැඩියාව | 55 | - | 55 |
| 2. දිස්ත්‍රික් කාර්යාල හා ගොවිජන සේවා මධ්‍යස්ථාන ඉදිකිරීම | 20 | 6.47 | 26.47 |
| 3. යන්ත්‍රෝපකරණ/වාහන අලුත්වැඩියාව/මිලදී ගැනීම (ඩෝසර්,ට්‍රැක්ටර් වෙනත්) | 45 | 12.17 | 57.17 |
| 4. කාර්යාල උපකරණ හා වෙනත් | 15 | - | 15 |
| 5. පොහොර ගබඩා ඉදිකරීම | 60 | - | 60 |
| 6. පුහුණු හා හැකියා වර්ධන | 2.5 | - | 2.5 |
| එකතුව | 197.5 | 18.64 | 216.14 |

2010 වසරේ ප්‍රගතිය

| විස්තරය | 2010.12.31 දිනට වියදම් (රු.මි.) | ප්‍රතිශතය |
|---|---|---|
| 1. වැඩසටහන - පුනරාවර්ථන | 163.50 | 94.2 |
| - මූලධන | 31.60 | 98.8 |
| | | |
| 2. වැඩසටහන - පුනරාවර්ථන | 2,579.34 | 69.7 |
| - මූලධන | 159.57 | 96.4 |
| තැන්පතු ගිණුම | 12.91 | 69.2 |

පුනරාවර්ථන වියදම් සැලකීමේදී මෙකී වැඩසටහන් දෙකෙහිම වැඩි දායකත්වයක් දරා ඇත්තේ වැඩසටහන් 2 හිම වන 10,824 ක වූ සේවක මණ්ඩලයේ පෞද්ගලික පඩිනඩි යටතේය. 2010 වර්ෂයේ දී කෘෂිකර්ම අමාත්‍යාංශය යටතේ වැටුප් ලැබූ නිලධාරීන් 157ක් දෙපාර්තමේන්තුවට අනුයුක්ත වී ඇති අතර, ගොවිජන සංවර්ධන නිලධාරින් 72ක් හා කමිටු ලිපිකරුවන් 93 දෙනෙකු ද වශයෙන් නිලධාරින් 322 ක් මේ වන විට අලුතින් බඳවා ගෙන ඇත.

මූලධන වියදම් සැලකීමේදී පුනරුත්ථාපන හා වැඩිදියුණු කිරීම සඳහා වැඩ සටහන් දෙක යටතේම වැඩි දායකත්වයක් දරා ඇති අතර, නව ඉදිකිරීම් හා නව ව්‍යාපෘති යටතේ පොහොර ගබඩා ඉදිකිරීම වෙනුවෙන් රු.මි. 59.6 ක් දරා ඇත. මීට අමතරව ගොවිජන සේවා මධ්‍යස්ථාන පුනරුත්ථාපනය කිරීමේ කටයුතු සඳහා රු.මි. 37.7 ක් 2010 වර්ෂයේදී දරා ඇත. එමෙන්ම 2010 වර්ෂයේදී අමාත්‍යාංශය මඟින් මෙහෙයවන " අපි වවමු - රට නගමු " වැඩසටහනේ පුරන් කුඹුරු අස්වැද්දීම, තරුණ ගොවි අරුණ, ගෙවතු වගා දිරිගැන්වීම, කෘ.ප.නි.ස. වරුන් සඳහා පරිවර්ථිත ගමන් වියදම් දීමනා ගෙවීම හා කාබනික පොහොර නිෂ්පාදනය හා දිරිගැන්වීමේ වැඩසටහන ද ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යටතේ වන සුළු වාරිමාර්ග පුනරුත්ථාපන වැඩසටහන, ජාතික සවිය ගම නැගුම වැඩසටහන ද යටතේ මෙම දෙපාර්තමේන්තුවට ලබා දෙන මුල්‍ය ප්‍රතිපාදන තුලින් ද වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි. කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලබා දී ඇති ප්‍රතිපාදන වලින් 82.6% ක් ද, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශ ප්‍රතිපාදන වලින් 84.4% ක්ද වැය දරා ඇත.

තවද 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනතේ 97(3) වගන්තිය යටතේ ප්‍රතිෂ්ඨාපිත ගොවිජන සංවර්ධන අරමුදලේ 2010 වර්ෂය සඳහා රැස්කර ගත් ආදායම රු.මි. 47.09කි. ඉන් 2010.12.31 දිනට වර්ෂයේ හඳුනාගත් ශීර්ෂ 9ක් යටතේ රු.මි. 34.17 ක වැය දරා ඇත.

## 7. අභ්‍යන්තර විගණන අංශය

2010 වර්ෂයේ අභ්‍යන්තර විගණන අංශයට අනුමත කාර්ය මණ්ඩලය 14ක් වන අතර, දැනට ප්‍රධාන කාර්යාලයේ අභ්‍යන්තර විගණන අංශයට අනුයුක්තව නිලධාරීන් 13 දෙනෙකු සේවය කරනු ලබයි. දිස්ත්‍රික් කාර්යාලවල රාජකාරි කරන සංවර්ධන සහකාර හා කෘෂි ව්‍යාපෘති සහකාර නිලධාරීන් 36 දෙනෙකු ඔවුන් රාජකාරි කරන දිස්ත්‍රික් කාර්යාලවල සිටින අතර, විගණන අංශය මගින් පවරනු ලබන රාජකාරිවල නිරත වේ.

2010 වර්ෂය තුළ ප්‍රධාන කාර්යාලය, කමිටු හා ගොවි බැංකු ආවරණය වන අයුරින් විගණන පරීක්ෂාවන් 125ක් සිදු කර ඇත. විස්තර පහත දැක්වේ.

2010 වර්ෂය තුළ විගණකාධිපති විගණන විමසුම් 119ක් ලැබී ඇති අතර, එම වර්ෂය තුළ ඉන් 13ක් සඳහා පිළිතුරු ලබා දී ඇත.

අභ්‍යන්තර විගණන පරීක්ෂණ සම්බන්ධ විස්තර

| | | |
|---|---|---|
| ප්‍රධාන කාර්යාලය | - | 01 |
| අනුරාධපුර | - | 03 |
| කළුතර | - | 10 |
| හම්බන්තොට | - | 07 |
| මොණරාගල | - | 11 |
| මහනුවර | - | 11 |
| ගම්පහ | - | 03 |
| අනුරාධපුරය | - | 05 |
| ගාල්ල | - | 02 |
| මාතර | - | 08 |
| අම්පාර | - | 05 |
| බදුල්ල | - | 08 |
| රත්නපුරය | - | 05 |
| කෑගල්ල | - | 04 |
| නුවරඑළිය | - | 08 |
| කුරුණෑගල | - | 24 |
| පුත්තලම | - | 05 |
| අනුරාධපුරය | - | 02 |
| කොළඹ | - | 03 |
| | | ----- |
| | | 125 |
| | | === |

## 8. ඵලදාවර්ධන හා අලෙවි අංශය

ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවේ පුමුඛතම කාර්යයක් වූ කෘෂි ඉඩම් කළ මනාකරණය මෙම අංශයේ ප්‍රධානතම කාර්යය වේ. ඒ අනුව කෘෂි ඉඩම් සඳහා මනා කළමනාකරණ ක්‍රමවේදයක් හඳුන්වා දී එමඟින් උපරිම අස්වැන්නක් රටට ලබාදීම මෙම අංශයේ ප්‍රමුඛතම ඉලක්කය වේ.

ඒ අනුව කාර්යක්ෂම ඉඩම් වගාව සම්බන්ධයෙන් කෘෂි ඉඩම් වගා කටයුතු සඳහා යොදාගැනීම දිරි ගැන්වීම හා ඒවා මනා ලෙස ඉටු නොකරන කුඹුරු හිමියන් පිළිබඳ සිදු කළ යුතු නෛතික ක්‍රියාදාමයන් ඇතුළත් 2009 වර්ෂයේ නිකුත් කරන ලද අංක 1585/15 ගැසට් පත්‍රය හා 2000 අංක 46 දරණ ගොවිජන සංවර්ධන පනත යටතේ කෘෂිකාර්මික ප්‍රතිපත්ති වලට අනුකූලව කෘෂිකාර්මික ඉඩම් යෙදවීම පිළිබඳව 2009 වර්ෂයේ නිකුත් කරන ලද 4/2009 චක්‍රලේඛය අනුව පුරන් කුඹුරු අක්කර 6632. 68 ක් පමණ වගා කරවීමට හැකියාව ලැබී ඇති බව පෙනී යයි.

කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන් සඳහා යෙදවීම සම්බන්ධයෙන් 2008 වර්ෂයේ ජූනි මස 25 දින සහ ඔක්තෝබර් මස 02 වන දින පැවති කැබිනට් මණ්ඩල රැස්වීම් අනුව “අපි වවමු - රට නගමු 2007-2010” දේශීය ආහාර නිෂ්පාදන දිරිගැන්වීමේ ජාතික මෙහෙවර උදෙසා වගා කළ හැකි සෑම බිම් අඟලක්ම වගා කිරීමේ පරමාර්ථයෙන් පනවන ලද තහනම් කාල සීමාව 2010.12.31 දින දක්වා දීර්ඝ කිරීම සිදුවී ඇති අතර, 2008.10.02 කැබිනට් තීරණය අනුව ක්‍රියාත්මක කරන ලද කෘෂිකර්ම අමාත්‍යාංශයීය කමිටුව මඟින් අත්‍යාවශ්‍ය කරුණු සඳහා පමණක් කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන් සඳහා යෙදවීමට අනුමැතිය ලබාදීම සිදු වී ඇත.

2010 වර්ෂයේ කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන් සඳහා යොදාගැනීමට ඉදිරිපත්ව තිබූ අයදුම්පත්‍ර සහිත ලිපිගොනු 240 ක් ප්‍රධාන කාර්යාලය වෙත යොමුවී ඇති අතර, 2010 වර්ෂය සඳහා පැවති එකම කෘෂිකර්ම අමාත්‍යාංශයීය කමිටුව වූ 2010.03.19 දිනැති කමිටුවට නිර්දේශ සම්පූර්ණ ලිපිගොනු 25 ක් ඉදිරිපත් කර ඇති අතර, එයින් අයදුම්පත්‍ර 05 ක් සඳහා කමිටුවේ අනුමැතිය ලබාදී ඇති අතර එම අයදුම්පත්‍ර සඳහා ගරු කෘෂිකර්ම අමාත්‍යතුමාගේ අනුමැතිය ලබාගැනීමද සිදුවී ඇත.

2010 වර්ෂයේ මැයි මස ඇතිවූ ගංවතුර තත්වයත් සමඟ අතිගරු ජනාධිපතිතුමන්ගේ ප්‍රධානත්වයෙන් 2010.05.18 දින අරලියගහ මන්දිරයේදී පැවති ආපදා සහන කටයුතු පිළිබඳ සාකච්ඡාවේදී පහත් බිම් ගොඩකිරීම වහාම නතර කළ යුතු බවට ගනු ලැබූ තීරණයත් සමඟ කුඹුරු ඉඩම් වෙනත් කාර්යයන් සඳහා යෙදවීම සහ කුඹුරු ඉඩමක් නොවන බවට සහතික නිකුත් කිරීම සම්බන්ධ කටයුතු තාවකාලිකව අත්හිටුවනු ලැබ ඇති අතර, ඒ සම්බන්ධයෙන් අංක 7/11/3 හා 2010.06.25 දිනැති ලිපිය මඟින් දිස්ත්‍රික් නියෝජ්‍ය / සහකාර කොමසාරිස් වරුන් දැනුවත් කිරීම සිදුවී ඇත. එහෙත් ප්‍රධාන කාර්යාලය වෙත මහජනතාවගෙන් ලැබෙන ඉල්ලීම් ප්‍රමාණයේ අඩුවීමක් සිදුවී නොමැති බව පෙනී යයි.

# 9. ගොවි බැංකු නියමු ව්‍යාපෘතිය

## මෙම ව්‍යාපෘතියේ අභිමතාර්ථ

1. ග්‍රාමීය ගොවි ජනතාවගේ දිලිදුකම තුරන් කිරීම සඳහා ඔවුන්ට අවශ්‍ය මූලධනය සපයා ගැනීමට සහාය වන ආයතනයක් ලෙස කටයුතු කිරීම.
2. ගොවි ජනතාවගේ ඉතිරි කිරීමේ නැඹියාව වර්ධනය කර ගැනීමට හා ඒ තුලින් ඔවුන්ගේ ආයෝජන ශක්තිය වර්ධනය කිරීමට සහාය වීම.
3. යැපුම් මට්ටමේ කෘෂිකර්මාන්තය වාණිජමය මට්ටමකට පත් කර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය හා ආර්ථික ශක්තිය වර්ධනය කරගැනීමට අවකාශ සැලසීම.
4. ගොවි ජනතාව සංවිධානගත කර ඔවුන්ගේ මූල්‍ය හා ආර්ථික ශක්තිය වර්ධනය කරගැනීමට අවකාශ සැලසීම.
5. ගොවි ජනතාව සමාජයීය වශයෙන් බලවත් සමාජ ස්ථරයක් බවට පත් කිරීම සඳහා අවශ්‍ය මූල්‍ය පරිසරය ගොඩ නැගීම.

උක්ත අභිමතාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා දිවයින පුරා පිහිටි ගොවිජන සේවා මධ්‍යස්ථාන 521ක් හරහා ගොවීන්ට අවශ්‍ය මූල්‍ය පහසුකම් සපයයි.

| අනු අංකය | දිස්ත්‍රික්කය | ගොවිජන සේවා මධ්‍යස්ථාන ගණන | පිහිටුවා ඇති ගොවිජන බැංකු ගණන |
|---|---|---|---|
| 1 | කොළඹ | 8 | 7 |
| 2 | ගම්පහ | 26 | 26 |
| 3 | කළුතර | 20 | 19 |
| 4 | මහනුවර | 45 | 45 |
| 5 | මාතලේ | 23 | 23 |
| 6 | නුවරඑළිය | 22 | 22 |
| 7 | ගාල්ල | 33 | 33 |
| 8 | මාතර | 22 | 22 |
| 9 | හම්බන්තොට | 16 | 16 |
| 10 | කුරුණෑගල | 55 | 55 |
| 11 | පුත්තලම | 18 | 18 |
| 12 | අනුරාධපුරය | 40 | 40 |
| 13 | පොළොන්නරුව | 13 | 11 |
| 14 | බදුල්ල | 31 | 30 |
| 15 | මොණරාගල | 18 | 17 |
| 16 | රත්නපුර | 30 | 30 |
| 17 | කෑගල්ල | 14 | 14 |
| 18 | අම්පාර | 29 | 28 |
| 19 | ත්‍රිකුණාමලය | 22 | 15 |
| 20 | මඩකලපුව | 17 | 12 |
| 21 | වව්නියාව | 8 | 6 |
| 22 | යාපනය | 15 | 15 |
| 23 | මන්නාරම | 12 | 8 |
| 24 | මුලතිව් | 10 | 4 |
| 25 | කිළිනොච්චි | 8 | 5 |
| | එකතුව | **556** | **521** |

- ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතියේ ගනුදෙනු කරන සාමාජිකයින් පිළිබඳ විස්තර පහත සඳහන් පරිදි වේ.

| | | |
|---|---|---|
| මුළු කොටස් කරුවන් සංඛ්‍යාව | - | 316,394 |
| මුළු ඉතිරි කිරීමේ ගිණුම් සංඛ්‍යාව | - | 128,728 |
| මුළු කණ්ඩායම් ගිණුම් සංඛ්‍යාව | - | 20,638 |

- ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතිය මඟින් සපයන ණය වර්ග පහත පරිදි වේ.
  1. කෘෂි වගා ණය
  2. වී අස්වැන්න නෙලීමේ ණය
  3. වී අස්වැන්න සුරැකීමේ ණය
  4. කෘෂි යන්ත්‍රෝපකරණ ණය
  5. ව්‍යාපෘති ණය
  6. ගොවි විශ්‍රාම රක්ෂණ ණය

- ගොවිජන බැංකු විසින් ලබාදෙන ණය සඳහා වාර්ෂික ණය පොලී අනුපාතය 9% ක් වන අතර කොටස් හා ඉතිරි කිරීම් තැන්පතු සඳහා ගෙවනු ලබන පොලී ප්‍රතිශතය 2010.07.01 දින සිට 7.5% සිට 5% දක්වා අඩුකර ඇත.

- 2010.12.31 දක්වා ණය නිකුත් කිරීම් හා අයකිරීම් ප්‍රගතිය පහත සඳහන් පරිදි වේ.

| අනු අංකය | විස්තරය | 1998 සිට 2010.12.31 දක්වා (රු) |
|---|---|---|
| 1 | ණය නිකුත් කිරීම | 3,535,065,432 |
| 2 | ණය අයකිරීම | 3,082,964,720 |
| 3 | තවදුරටත් අයකර ගත යුතු ශේෂය | 452,100,712 |
| 4 | ණය අයකර ගැනීමේ ප්‍රගතිය | 87% |

- 2010.12.31 ට ඒකාබද්ධ කරන ලද ගොවිජන බැංකු නියමු ව්‍යාපෘතියේ මූල්‍ය තොරතුරු වලින් කොටසක් පහත සඳහන් පරිදි වේ.

| අයිතමය | ශේෂය (රු) |
|---|---|
| ඉතිරි කිරීම් හා ස්ථාවර ගිණුම් | 407,712,374 |
| ජංගම ගිණුම් ඉතිරි | 42,352,537 |
| අත ඉතිරි | 2,255,685 |
| ණයගැතියෝ | 452,100,712 |
| ගොවින්ගේ කොටස් මුදල් පාලන ගිණුම | 121,175,870 |
| ප්‍රාග්ධන ගිණුම | 283,426,980 |
| ගොවීන්ගේ ඉතිරි කිරීම් පාලන ගිණුම | 158,343,497 |
| ගොවින්ගේ කණ්ඩායම් ගිණුම් පාලන ගිණුම | 57,300,447 |

# 10. ප්‍රවාහන අංශය

2010 වර්ෂයේ දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරන ලද සියළුම සංවර්ධන වැඩ, පනතේ නීතිමය කාර්යයන් සහ පරිපාලන මඟින් පැවරෙන විවිධ නිල ප්‍රවාහන කටයුතු සඳහා ප්‍රවාහන අංශයේ විශාල දායකත්වයක් ලබා දෙන ලදි. මේ සඳහා සැහැල්ලු වාහන වන ජීප්,ඩබල් කැබ් සහ මෝටර් රථ, ලොරි රථ, ටෙන් වීල් සහ ප්‍රයිම් මූවර් රථ ඇතුලුව වාහන 104 පමණ වන දෙපාර්තමේන්තුව සතු වාහන ඇණියක් ඇත. එම වාහන අතර ඉතා පැරණි වාහන ඇති බැවින් නිරන්තරයෙන් ඇති වන අලුත් වැඩියාවන් සහ නඩත්තු ඉටුකර ගනිමින් ඉහත කාර්යයන්ට කිසිදු බාධාවකින් තොරව අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා දීඇත.

මීට අමතරව ප්‍රධාන කාර්යාලය ඇතුළු සියළු දිස්ත්‍රික් කාර්යාල වල ඇති වාහන වල සියළුම නඩත්තු, අළුත් වැඩියා, ඉන්ධන සඳහා ප්‍රතිපාදන වෙන්කර දීම, ආදායම් බල පත්‍ර ලබා ගැනීම, අනතුරු, ධාවන සටහන් විගණනය වෙත ඉදිරිපත් කිරීම, විගණන විමසුම් සඳහා පිලිතුරු සැපයීම, වාහන රක්ෂණය, වාර්ෂික ඇස්තමේන්තු සැකසීම, ප්‍රවාහන කටයුතු සම්බන්ධ දත්ත ඉහල පරිපාලනයට වාර්තා කිරීම. ඉන්ධන ඇනවුම් නිකුත් කිරීම, බිල්පත් පියවීම මේ අංශය මඟින් සිදු කෙරේ.

2010 වර්ෂය සඳහා ඉටුකර ඇති කාර්යයන්.

1. නිළධාරි ප්‍රවාහන කටයුතු - කොළඹ සහ දිස්ත්‍රික් රාජකාරි සඳහා
2. දිවි නැඟුම - දිවයින පුරා බීජ ප්‍රවාහනයට ලොරි රථ යෙදවීම (බීජ කට්ටල් ලක්ෂ 15ක් හා පොහොර කට්ටල් ලක්ෂ 15ක් සති 03ක් වැනි කෙටි කාලයක් තුලදී දෙපාර්තමේන්තු ලොරි රථ 18ක් මගින් සුරක්ෂිතව දිවයින පුරා බෙදා හැර ඇත)
3. දිවයින පුරා ඇති වැව් ප්‍රතිසංස්කරණය සඳහා බුල්ඩෝසර් සහ එක්ස්කැවේටර් යන්ත්‍ර ප්‍රවාහනය සඳහා ලොරි රථ යෙදවීම
4. උතුරු වසන්තය , නැගෙනහිර වසන්තය, පුරන් කුඹුරු අස්වැද්දීම, කෘෂිබෝග පුරෝකතන ආදී ප්‍රධාන සංවර්ධන ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රවාහන කටයුතු සැපයීම
5. අළුත් සහල් මංගල්‍යය, දැයට කිරුළ, වප් මඟුල වැනි ජාතික උත්සව සඳහා අවශ්‍ය ප්‍රවාහන කටයුතු සැපයීම
6. රියදුරු, රියසහායක පැමිණීමේ ලේඛන, නිවාඩු, වැටුප් වර්ධක නිර්දේශ, අමතර ගමන් වියදම් දීමනා ලබා දීම ආදී කටයුතුද මෙම අංශය මඟින් සිදු කෙරේ.

ඇමුණුම 2.1

## "අපි වවමු - රට නගමු" දේශීය ආහාර නිෂ්පාදන දිරි ගැන්වීමේ ජාතික මෙහෙයුම 2007 - 2010

## පුරන් කුඹුරු වගා කිරීමේ වැඩ සටහන - 2010 දෙසැම්බර් මස 31 දිනට ප්‍රගති වාර්තාව

වෙන් කර ඇති ප්‍රතිපාදන රු.මි. 110 ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

| දිස්ත්‍රික්කය | වැය ශීර්ෂය | අස්වද්දන ලද අක්කර ගණන | ප්‍රතිලාභ ලබන පවුල් සංඛ්‍යාව | ඇස්තමේන්තු ගත මුළු වියදම රු. | සත්‍ය වියදම රු. 2010.12.31 දිනට | 2010 දිස්ත්‍රික්ක වෙත නිදහස් කල ප්‍රතිපාදන රු. | මූල්‍ය ප්‍රගතිය | භෞතික ප්‍රගතියේ ප්‍රතිශතය (සාමාන්‍ය) | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | | | සුළු වාරිමාර්ග නිර්මිත හා ඇල මාර්ග ප්‍රතිසංස්කරණය % | කැලෑව ශුද්ධ කිරීම | වල් නාශක යෙදීම | බිම් සකස් කිරීම | වැපිරීම / පැල සිටුවීම |
| කොළඹ | 118-2-3-20-2502 | 658 | 809 | 7,556,303.97 | 6,448,584.91 | 11,145,825.00 | 58% | 100% | - | - | - | - |
| ගම්පහ | 118-2-3-20-2502 | 1213 | 1737 | 8,544,012.42 | 8,753,661.87 | 8,619,065.00 | 102% | 96% | 94% | 100% | 90% | 97% |
| කළුතර | 118-2-3-20-2502 | 498 | 779 | 5,233,945.80 | 4,751,463.60 | 4,885,790.00 | 97% | 100% | 100% | 100% | 100% | 100% |
| මහනුවර | 118-2-3-20-2502 | 192.5 | 282 | 5,576,472.04 | 3,099,949.17 | 5,515,515.30 | 56% | 58% | 53% | 88% | 66% | 66% |
| මාතලේ | 118-2-3-20-2502 | 107 | 150 | 3,430,049.89 | 3,356,043.72 | 3,382,011.80 | 99% | 98% | - | - | - | - |
| නුවරඑළිය | 118-2-3-20-2502 | 123 | 429 | 4,936,195.86 | 4,933,186.59 | 5,037,600.00 | 98% | 100% | - | - | - | - |
| ගාල්ල | 118-2-3-20-2502 | 806.8 | 934 | 3,909,351.92 | 4,281,928.18 | 5,285,000.00 | 81% | 94% | - | 100% | - | - |
| මාතර | 118-2-3-20-2502 | 618.1 | 615 | 4,668,760.58 | 4,456,182.68 | 4,830,000.00 | 92% | 100% | 100% | 100% | - | - |
| හම්බන්තොට | 118-2-3-20-2502 | 151 | 103 | 4,335,639.24 | 4,134,526.24 | 3,446,000.00 | 120% | 100% | - | - | - | - |
| යාපනය | 118-2-3-20-2502 | 690.1 | 552 | 3,000,000.00 | 2,760,293.32 | 2,760,293.32 | 100% | - | 100% | 100% | 100% | |
| මන්නාරම | 118-2-3-20-2502 | 350 | 350 | 2,517,550.00 | 1,359,675.00 | 1,993,000.00 | 68% | - | 100% | 100% | 100% | 100% |
| වවුනියාව | 118-2-3-20-2502 | 61 | 61 | 585,600.00 | 605,600.00 | 1,040,000.00 | 58% | - | 100% | - | - | - |
| මුලතිවු | 118-2-3-20-2502 | 260 | 260 | 1,500,000.00 | 2,371,090.44 | 2,390,000.00 | 99% | - | - | 100% | 100% | - |
| කිලිනොච්චිය | 118-2-3-20-2502 | 207 | 264 | 1,359,990.00 | 1,379,977.00 | 1,730,950.00 | 80% | - | - | 100% | 100% | - |
| මඩකලපුව | 118-2-3-20-2502 | 1438 | 889 | 4,960,260.00 | 4,960,260.00 | 4,148,000.00 | 120% | - | - | 100% | - | 100% |
| අම්පාර # | 118-2-3-20-2502 | - | - | 52,470.00 | 52,470.00 | 52,470.00 | 100% | - | - | - | - | - |
| ත්‍රිකුණාමලය | 118-2-3-20-2502 | 361 | 135 | 5,043,424.00 | 3,787,536.00 | 3,190,000.00 | 119% | - | 100% | 100% | 100% | - |
| කුරුණෑගල | 118-2-3-20-2502 | 277 | 361 | 4,941,479.20 | 4,736,398.74 | 4,784,764.80 | 99% | 100% | - | - | - | - |
| පුත්තලම | 118-2-3-20-2502 | 583 | 712 | 8,526,045.54 | 8,498,000.00 | 8,498,000.00 | 100% | 100% | 100% | - | 100% | 100% |
| අනුරාධපුරය | 118-2-3-20-2502 | 488 | 368 | 8,004,378.96 | 7,773,153.00 | 8,463,205.00 | 92% | 100% | - | - | - | - |
| පොළොන්නරුව | 118-2-3-20-2502 | 335 | 166 | 3,254,370.00 | 3,687,791.65 | 4,500,000.00 | 82% | 100% | - | 100% | - | - |
| බදුල්ල | 118-2-3-20-2502 | 180 | 350 | 7,307,726.66 | 5,413,579.52 | 7,271,368.00 | 74% | 94% | - | - | - | - |
| මොණරාගල | 118-2-3-20-2502 | 162 | 91 | 5,352,000.00 | 4,546,702.50 | 4,860,000.00 | 94% | 100% | - | - | - | - |
| රත්නපුර | 118-2-3-20-2502 | 125 | 242 | 1,652,259.76 | 1,713,204.10 | 1,440,000.00 | 119% | 96% | 88% | 78% | 93% | 100% |
| කෑගල්ල | 118-2-3-20-2502 | 78 | 183 | 1,923,302.60 | 2,095,562.74 | 2,387,324.27 | 88% | 100% | - | - | - | - |
| ප්‍ර.කාර්යාලය | 118-2-3-20-2502 | | | | | 1,000,000.00 | | | | | | |
| **එකතුව** | **118-2-3-20-2502** | **9,963** | **10,822** | **108,171,588.44** | **99,956,820.97** | **112,656,182.49** | **89%** | **96%** | **94%** | **97%** | **95%** | **83%** |

# අම්පාර දිස්ත්‍රික්කයේ මෙම වැඩ සටහන අක්‍රිය තත්වයේ ඇත

ඇමුණුම 2.2

## 2KR 2008 ජපන් ආධාර ව්‍යාපෘතිය යටතේ ලද

## කෘෂියන්ත්‍රෝපකරණ දිස්ත්‍රික්ක වෙත බෙදාහැරීම

| පළාත | | දිස්ත්‍රික්කය | රෝද 04 ට්‍රැක්ටර් (තැටි නගුල් සමඟ) | | රෝද 02 ට්‍රැක්ටර් (නගුල්, අමතර කොටස් කට්ටල සමඟ) | | එන්ජිම සහිත වතුර පොම්ප | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | එකතුව | | එකතුව | | එකතුව |
| බස්නාහිර | 1 | කොළඹ | - | | 5 | | - | |
| | 2 | ගම්පහ | - | | 10 | | - | |
| | 3 | කළුතර | - | 0 | 10 | 25 | - | 0 |
| මධ්‍යම | 4 | මහනුවර | - | | 20 | | - | |
| | 5 | මාතලේ | - | | 35 | | - | |
| | 6 | නුවරඑළිය | - | 0 | 15 | 70 | - | 0 |
| දකුණ | 7 | ගාල්ල | - | | 10 | | - | |
| | 8 | මාතර | - | | 15 | | - | |
| | 9 | හම්බන්තොට | 2 | 2 | 70 | 95 | 48 | 48 |
| උතුර | 10 | යාපනය | 3 | | 20 | | 14 | |
| | 11 | කිළිනොච්චි | 4 | | 32 | | 8 | |
| | 12 | මන්නාරම | 4 | | 36 | | 24 | |
| | 13 | වවුනියාව | 4 | | 24 | | 16 | |
| | 14 | මුලතිව් | 4 | 19 | 40 | 152 | 10 | 72 |
| නැගෙනහිර | 15 | මඩකලපුව | 4 | | 80 | | 17 | |
| | 16 | අම්පාර | 4 | | 70 | | 58 | |
| | 17 | ත්‍රිකුණාමලය | 4 | 12 | 94 | 244 | 44 | 119 |
| වයඹ | 18 | කුරුණෑගල | - | | 80 | | 53 | |
| | 19 | පුත්තලම | - | 0 | 68 | 148 | 17 | 70 |
| උතුරු මැද | 20 | අනුරාධපුරය | - | | 75 | | 37 | |
| | 21 | පොළොන්නරුව | 2 | 2 | 50 | 125 | 24 | 61 |
| ඌව | 22 | බදුල්ල | - | | 45 | | - | |
| | 23 | මොණරාගල | - | 0 | 50 | 95 | 20 | 20 |
| සබරගමුව | 24 | රත්නපුරය | - | | 30 | | - | |
| | 25 | කෑගල්ල | - | 0 | 20 | 50 | - | |
| | | එකතුව | | 35 | | 1004 | | 390 |

# <u>ව්‍යාපෘති අනුව මූලධන වියදම්</u>

**වියදම් ශීර්ෂ අංකය : 281** **ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**වැඩ සටහන් අංකය හා නාමය : 1 මෙහෙයුම්**

**ව්‍යාපෘති අංකය හා නාමය: 1 සාමාන්‍ය පරිපාලන හා ආයතන සේවා**

| වැය විෂය අංකය | අයිතම් අංකය | මූල්‍යකරණය (සංකේත අංකය) | අයිතම් විස්තරය | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | මු.රෙ.66, 69 අනුව මාරු කිරීම් | | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / (අතිරික්තය) (3-4) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | එකතු කලා | අඩු කලා | | | |
| | | | | (1) | (2) | | (3) | (4) | (5) |
| | | | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පුනරුත්ථාපන හා වැඩිදියුණු | | | | | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි | 15,000,000.00 | | | 15,000,000.00 | 14,918,129.28 | 81,870.72 |
| 2003 | | 11 | වාහන | 9,500,000.00 | | | 9,500,000.00 | 9,499,625.83 | 374.17 |
| | | | උප එකතුව | **24,500,000.00** | | | **24,500,000.00** | **24,417,755.11** | **82,244.89** |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | | | | | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කා/උපකරණ | 5,000,000.00 | | | 5,000,000.00 | 4,931,632.94 | 68,367.06 |
| | | | උප එකතුව | **5,000,000.00** | | | **5,000,000.00** | **4,931,632.94** | **68,367.06** |
| හැකියා වර්ධනය | | | | | | | | | |
| 2401 | | 11 | පුහුණු කිරීම | 2,500,000.00 | | | 2,500,000.00 | 2,268,138.19 | 231,861.81 |
| | | | උප එකතුව | **2,500,000.00** | | | **2,500,000.00** | **2,268,138.19** | **231,861.81** |
| | | | මුළු එකතුව | **32,000,000.00** | | | **32,000,000.00** | **31,617,526.24** | **382,473.76** |

# ව්‍යාපෘති අනුව මූලධන වියදම්

**වියදම් ශීර්ෂ අංකය : 281** ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව

**වැඩ සටහන් අංකය හා නාමය : 2 සංවර්ධනය**

**ව්‍යාපෘති අංකය හා නාමය: 2 ගොවිජන සේවා පනත ක්‍රියාත්මක කිරීම**

| වැය විෂය අංකය | අයිතම අංකය | මූල්‍යාධාරය (සංකේත අංකය) | අයිතම් විස්තරය | අයවැය ඇස්තමේන්තු වෙන් කිරීම් | මු.රෙ.66, 69 අනුව මාරු කිරීම් | | මුළු ශුද්ධ වෙන් කිරීම් (1+2) | මුළු වියදම | ශුද්ධ ප්‍රතිඵලය ඉතිරිය / (අතිරික්තය) (3-4) |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | එකතු කලා | අඩු කලා | | | |
| | | | | (1) | (2) | | (3) | (4) | (5) |
| | | | | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| පුනරුත්ථාපන හා වැඩිදියුණු | | | | | | | | | |
| 2001 | | 11 | ගොඩනැගිලි | 40,000,000.00 | | | 40,000,000.00 | 39,675,741.31 | 324,258.69 |
| 2002 | | 11 | යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 10,000,000.00 | 1,587,000.00 | | 11,587,000.00 | 11,559,489.00 | 27,511.00 |
| 2003 | | 11 | වාහන | 10,500,000.00 | 840,100.00 | | 11,340,100.00 | 11,339,878.61 | 221.39 |
| | | | උප එකතුව | **60,500,000.00** | **2,427,100.00** | | **62,927,100.00** | **62,575,108.92** | **351,991.08** |
| මූලධන වත්කම් අත්පත් කර ගැනීම් | | | | | | | | | |
| 2102 | | 11 | ගෘහ භාණ්ඩ හා කා/උපකරණ | 10,000,000.00 | 7,000,000.00 | | 17,000,000.00 | 16,887,527.24 | 112,472.76 |
| 2103 | | 11 | යන්ත්‍රෝපකරණ | 15,000,000.00 | | 7,427,100.00 | 7,572,900.00 | 7,246,292.20 | 326,607.80 |
| 2104 | | 11 | ගොඩනැගිලි | 20,000,000.00 | | 2,000,000.00 | 18,000,000.00 | 14,812,329.60 | 3,187,670.40 |
| | | | උප එකතුව | **45,000,000.00** | **7,000,000.00** | **9,427,100.00** | **42,572,900.00** | **38,946,149.04** | **3,626,750.96** |
| වෙනත් යෝජනා | | | | | | | | | |
| 8-2104 | | 11 | පොහොර ගබඩා ඉදිකිරීම | 60,000,000.00 | | | 60,000,000.00 | 59,680,204.36 | 319,795.64 |
| | | | උප එකතුව | **60,000,000.00** | | | **60,000,000.00** | **59,680,204.36** | 319,795.64 |
| | | | මුළු එකතුව | **165,500,000.00** | **9,427,100.00** | **9,427,100.00** | **165,500,000.00** | **161,201,462.32** | **4,298,537.68** |

ඇමුණුම 3.3

**ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව**

**2010 දෙසැම්බර් 31 දිනට සංවර්ධන වැඩ ප්‍රගතිය**

**ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය - සුළු වාරි මාර්ග ප්‍රතිසංස්කරණය 2010**

| අංකය | දිස්ත්‍රික්කය | ලැබුණු ප්‍රතිපාදනය රු.මිලි | කර්මාන්ත ගණන | මුදල් ගෙවීම රු.මිලි | වෙනත් කරුණු |
|---|---|---|---|---|---|
| 1 | මහනුවර | 50.00 | 212 | 48.60 | |
| 2 | බදුල්ල | 05.00 | 81 | 00.36 | |
| 3 | කෑගල්ල | 29.01 | 111 | 29.01 | |
| 4 | අනුරාධපුර | 29.00 | 47 | 27.00 | |
| 5 | මාතලේ | 58.43 | 109 | 54.11 | |
| 6 | ගම්පහ | 23.79 | 75 | 16.26 | |
| 7 | කුරුණෑගල | 00.98 | 01 | 00.19 | |
| 8 | නුවරඑළිය | 10.70 | 20 | 10.79 | |
| 9 | වව්නියාව | 13.28 | 09 | 08.06 | |
| | **උප එකතුව** | **220.29** | **665** | **194.29** | |
| | **(දිස්ත්‍රික් ලේකම්වරු හරහා ලැබුණු ප්‍රතිපාදන)** | | | | |
| 10 | පොළොන්නරුව | 19.00 | 23 | 10.88 | |
| 11 | හම්බන්තොට | | 42 | 21.50 | |
| 12 | මාතර | 03.90 | 01 | 03.90 | 2009 වර්ෂයට මිලි.15ක් ලැබී ඇත. 2010 වසරට අවිච්ඡේද වී ඇත. |
| 13 | කුරුණෑගල | 15.00 | 149 | 14.65 | |
| 14 | මන්නාරම | 117.80 | 27 | 86.40 | |
| 15 | පුත්තලම | 15.00 | 149 | 14.65 | |
| 16 | කළුතර | 05.52 | 24 | 04.70 | |
| 17 | රත්නපුරය | 02.00 | 06 | 01.38 | |
| 18 | මොණරාගල | 04.80 | 11 | 04.30 | |
| 19 | අම්පාර | 09.39 | 10 | 07.25 | |
| 20 | කොළඹ | 12.37 | 85 | 12.37 | |
| 21 | යාපනය | 23.31 | 16 | 22.51 | |
| 22 | කිලිනොච්චි | 59.59 | 30 | 59.59 | ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් Rap සහ Enrap සංවිධාන වෙත ප්‍රතිපාදන ලබා දී මෙම කර්මාන්ත ඉටු කරවා ඇත. |
| 23 | වව්නියාව | 20.88 | 08 | 04.76 | |
| | **උප එකතුව** | **308.56** | **581** | **268.84** | |
| | **2010 එකතුව** | **528.84** | **1246** | **463.13** | |